# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීම් වාර්තාව.
# 2019.03.19

වර්ෂ 2019 ක් වූ මාර්තු මස 19 වැනි අඟහරුවාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ මාර්තු මස මහා සභා රැස්වීම් වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
03. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
04. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
05. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
06. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
07. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්ප ලියනගේ මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
09. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
10. ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
11. ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය
12. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
14. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
15. ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා
16. ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
17. ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
18. ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
19. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
20. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
21. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි**

01. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා

මීට අමතරව ප්‍රාදේශීය සභා ලේකම් අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**<u>ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.</u>**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අද විදුලිය විසන්ධිවෙලා තියෙන්නේ. ඒ හින්දා මයික්‍රෆෝන පද්ධතිය ක්‍රියා කරන්නේ නෑ. මේ හේතුව නිසා නිශ්ශබ්දව තමුන්ගේ වාරයේදී විතරක් කතාකරන්න කියලා මම ඉල්ලා සිටිනවා. බාධා කිරීම් කරන්න එපා පටිගත වෙන එකක් නෑ.

අන්තිමට චෝදනා කරන්න එපා වාර්තා වෙලා නෑ කියලා. තමුන්ගේ වාරය ආවම අදාල මන්ත්‍රීවරයා හෝ මන්ත්‍රීවරිය අදහස් ප්‍රකාශ කිරීම සිදු කරන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඩඩ්ලි විජේසිංහ මන්ත්‍රීතුමා අසනීප තත්වයේ පසුවන නිසා එතුමාට අද සභා රැස්වීමට සහභාගීවීමට හැකියාවක් ලැබෙන්නේ නෑ. එතුමාට නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**1) 2019.02.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019.02.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න නැත්නම් 2019.02.18 දින පැවති මහා සභා වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා මුලින්ම හොඳ ප්‍රකාශයක් කරා. ඒක හොඳයි. බාධාකිරීම් නැතුව අපි හෙමින් කතා කරමු. අපිට සභාව ගෙනියන්නයි ඕන. නමුත් අද දවසේ ඇත්තටම විදුලිය විසන්ධි වෙලා තියෙනවා. මේවා මෙහෙම වෙන්නේ ඇයි කියලා මට තේරෙන්නේ නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අබේසේකර මන්ත්‍රීතුමා වාර්තාවේ අඩුපාඩුකම් තියේනම් පෙන්වලා දෙන්න. ඊට පරිබාහිර දෙයක් තියේ නම් පස්සේ කතා කරන්න. මම හිතනවා මෙම වාර්තාවේ අඩුපාඩුකම් නෑ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇත්තටම ගරු සභාපතිතුමනි මේ ප්‍රශ්නය තියෙනවා. චමින්ද මන්ත්‍රීතුමා එක්ක මගේ පෞද්ගලික ආරවුලක් නෑ. 2013 ගෙනාපු යෝජනාවක් පිළිබඳව සාකච්ඡාවට බඳුන් කරලා කතාවක් ගියා. මම ඒ යෝජනාවට මුල ඉඳලම පක්ෂයි. නමුත් මේ යෝජනාවේ ඇතුලත් කරලා තියෙනවා මම ඒ යෝජනාවට පක්ෂ නෑ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කොතනද එහෙම තියෙන්නේ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම සභා ගර්භයෙන් ගියාට පස්සේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එතුමා කරපු ප්‍රකාශයේ වගකීම එතුමා දරනවා. මම දැන් අවස්ථාව දුන්නේ සභාවාර්තාවේ තියෙන අඩුපාඩුකම් පෙන්වා දෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ වාර්තාවට ඒක ඇතුලත් වෙන්න ඕන. මම නොහිටපු වෙලාවේ කතා කරපු එකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා නොහිටපු වෙලාවේ කතාවට උත්තර දැන් වාර්තාවට ඇතුලත් කරන්න බෑ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මට ඒක ගැන කියන්න ඕන. ඔබතුමා මට ඒක ගැන කියන්න අවස්ථාවක් දෙන්න. විරෝධ ආකල්පයක් නෙමෙයි මම මේ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමාට ඒකට අවස්ථාවක් දෙන්නම්. නමුත් ඔබතුමා හිටපු නැති වෙලාවේ වුන කතාවට උත්තර දැන් මේ වාර්තාවට ඇතුළත් කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සභාවට ඇතුළත් කරන්න නෙමෙයි. ඊළග සභා වාර්තාවේ හරි ඒක යන්න ඕන.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගීවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මෙතන පොඩි වැරදීමක් වෙලා තියෙනවා.

40 පිටුව

- " එගොඩහ කනත්තේ සංස්කෘතික මධ්‍යස්ථානය අවටත් තියෙනවා." ඒක "ගොඩකන්දේ සංස්කෘතික මධ්‍යස්ථානය අවටත් තියෙනවා." ලෙස සංශෝධනය විය යුතුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමන්ලාට පේනවා ඇති වාර්තාව එන්න එන්නම හොඳ තත්ත්වයට පත්වෙනවා. අපි චෝදනා කරනවා වගේම ඒ නිලධාරියාට ස්තුතිවන්ත වෙන්න ඕන. ඒක ලේසි පහසු කටයුත්තක් නෙමෙයි.

ලබන මාසේ මහා සභා රැස්වීම අවුරුද්දට කලින් තියන්න ඕන. මන්ත්‍රීවරුන්ට අවුරුද්දෙන් පස්සේ රාජකාරි බහුලයි. ඒ නිසා මහා සභා රැස්වීම අවුරුද්දට කලින් තියන්න ඕන කියලා හැගීමක් මට තියෙනවා. නමුත් ගැටලුව තියෙන්නේ සභා වාර්තාව සකස් කිරීම පිළිබඳව. මේ වාර්තාව කෙටි කරලා සංක්ෂිප්ත කරලා යන්න වෙයි. අපිට මොකක්හරි ක්‍රමවේදයක් අනුගමනය කරන්න වෙයි. නැත්නම් අන්තිමට අඩුපාඩුකම් කියන්න එපා මේ මේ ගැටලු තියෙනවා කියලා. මට හිතෙනවා කවුරුත් එකගයි කියලා සභාව අවුරුද්දට කලින් තියන්න. අවුරුදු උත්සව, නෑ ගමන් ගියහම අවුරුද්දට පස්සේ සභා රැස්වීම තියන්න අපහසුයි.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සභා රැස්වීම පවත්වන දිනය පිළිබඳව අපි අවසානයට සාකච්ඡා කරමු. සභා වාර්තාව සංශෝධන වලට යටත්ව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2019.02.18 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019.02.18 දින පැවති මහ සභා වාර්තාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාර්තාවක් බවට ඒකමතිකව සභා සම්මත විය.

<u>**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව ථේරවාදී ත්‍රිපිටකය ලෝක උරුමයක් බවට පත්කිරීමට තිබෙන ත්‍රිපිටකාභිවන්දනා සතිය අනුව අපි තීරණය කලා මාර්තු 22 වෙනිදා පෙ.ව. 9.30 ට ධර්මදේශනයක් පැවැත්වෙනවා සභා පරිශ්‍රයේදී. මානවිල විද්‍යාප්‍රදීප පිරිවෙනෙහි පරිවේනාධිපති, ශාස්ත්‍රපති මාතලේ සෝමිස්සර හිමිපාණන් වහන්සේ තමයි ඒ ධර්මදේශනාව පවත්වන්නේ. සියලුම මන්ත්‍රීතුමන්ලාට මන්ත්‍රීතුමියන්ලාට මම ආරාධනා කරනවා ධර්ම දේශනාව ශ්‍රවණය කරන්න පැමිණෙන්න කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**<u>(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන සභාව ඉදිරියේ තැබීම,</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. මොන්රෝවියා වත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ පවතින ගැටලු විසඳීම සම්බන්ධවයි. (රනිල් වික්‍රමසේකර මයා, පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත)

අපිට තිබුනේ ලීටර් 2000 ක වතුර ටැංකියක් සපයලා දීම. අපි ඒ ටැංකිය සපයලා දුන්නා. ඒ ටැංකිය දැන් ස්ථාපිත කරලා තියෙනවා. අපි පෙරේදා සිට නැවත දිරන කසළ පමණක් මොන්රෝවියා වත්ත කසළ කළමනාකරණ අංගනයට යැවීමට කටයුතු කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** නොදිරන ඒවාට මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නොදිරන ඒවාටත් ඉදිරියේදී ක්‍රියාමාර්ගයක් ගන්න වෙනවා. මට ඊයේ තිබුණ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වෙන්න බැරිවුනා පුහුණුවකට සහභාගි වෙන්න ගිය නිසා. මම කාරක සභාවක් යෝජනා කරනවා ඊයේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී මේ කසළ ප්‍රශ්නය සම්බන්ධව කතා කරපු දේවල් ගැන ලේකම්තුමාට සභාව දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>කාරක සභා අවස්ථාව</u>**

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා පහත අදහස් දක්වන ලදී.

- ❖ මාස දෙකක පමණ කාලයක සිට මොන්රෝවියා වත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත කසළ බැහැරලීමේ ගැටලුවක් පැන නැගී ඇති බව.
- ❖ දැනට ඉඳුල් පමණක් මොන්රෝවියා වත්ත කසළ කළමනාකරණ මධ්‍යස්ථානය වෙත බැහැර කරන බව.
- ❖ නරාවල ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමකට සෞඛ්‍ය ආරක්ෂිත ලෙස කසළ බැහැරකිරීම සිදු කළද, එම ප්‍රදේශය භාර කෘ.ප.නි.ස. නිලධාරිවරයා විරුද්ධ වීම නිසා එම ඉඩමට කසළ බැහැරකිරීම නැවැත්වූ බවට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කළ බව.
- ❖ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ තීරණය පරිදි නරාවල ප්‍රදේශයේ පිහිටි එම පෞද්ගලික ඉඩමට කසළ බැහැර කිරීම සිදු කරන ලෙස ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව දැනුම් දුන් බව.
- ❖ බලප්‍රදේශයේ වෙනත් පෞද්ගලික ඉඩම් තිබේ නම් සෞඛ්‍ය ආරක්ෂිත ලෙස කසළ බැහැරකිරීම සිදු කළ හැකි බව.

මීට අමතරව මන්ත්‍රීවරුන්ද මේ ගැටලුව සම්බන්ධව සිය අදහස් දක්වා සිටින ලදී.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ ඉතා ගැටලුකාරි තත්ත්වයක් තියෙන්නේ මේ කුණු ප්‍රශ්නය. හැබැයි අපි නරාවල ප්‍රදේශයේ කසළ බැහැර කරද්දි අඩි 03 ක විතර පස් තට්ටුවක් දැම්මා. මම යෝජනා කරනවා එතන වගා කරන්න. එහෙම වගා කරන්න පුරුදුකරහම අවුරුද්දක්, දෙකක් යනකොට ඒ ගස් ටික දැක්කහම තව කෙනෙකුට හිතෙයි තමුන්ගේ ඉඩමේත් මේ වගේ දෙයක් කරොත් හොඳයි කියලා. කියාස් මන්ත්‍රීතුමා කිව්වා ඉඩමක් තියෙයි කියලා. අපි ඒක ඉදිරියේදී බලමු.

හැබැයි මෙතනදී මම මෙහෙම දෙයක් කරන්න බලාපොරොත්තු වෙනවා. ඉඳුල් පමණක් මේ තැන් වලට දාන්න පුලුවන්නම් ඒක දිරලා යනවා. පොලිතින් සහ ප්ලාස්ටික් වෙන වෙනම වෙන් කරන්න ඕන. ඒක අපිට සභාවෙන් කරන්නත් පුලුවන්. ඒක කරානම් වෙනම ආදායමකුත් සභාවට එනවා. කාඩ්බෝඩ් ටික වෙනම විකුණගන්න පුලුවන්. වීදුරු කටු ටික වෙනම විකුණ ගන්න පුලුවන්. පොලිතිනුත් වෙනම විකුණන්න පුලුවන්. හැබැයි හෝදන්න ඕන. ඒවගේ ව්‍යාපෘතියක් කරන්න ඕන. ඒක කරන්න පර්චස් 40 ක විතර ඉඩම් කැල්ලක් තිබුණනම් ඇති.

(ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- වෙනදට අපේ ට්‍රැක්ටර් 04ක් 05 ක් යනවා මොන්රෝවියා වත්තට. දැන් යන්නේ ඉඳුල් විතරක් එකතු කරන්න නිසා ට්‍රැක්ටර් භාගයයි යන්නේ. අනිත් ඒවා ඉතුරු වෙනවා. 15% ක් ඉඳුල් යන්නේ. ඉතුරු 85% යන්නේ පොලිතින්, කාඩ්බෝඩ්, ප්ලාස්ටික් යන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒකට අදහසක් විදියට මම කියන්නේ පුරුදු කර ගන්න ඕනේ කුණු එකතු කරලා මේ දේ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපිට භූමියක අඩුපාඩුවක් තියෙනවා. ස්ථානයක් තියේ නම් අපිට ක්‍රමවේදයක් හදන්න පුලුවන්.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට නරාවල ඉඩමේ දිගටම කුණු දාන්න බැරිවෙයි. අපිට තව ඉඩමක් හොයා ගත්තත් ටික කාලයයි කුණු දාන්න පුලුවන්. මම කියපු ක්‍රමයට ඉඩම් හදලා වගා කරන්න පුරුදු කරන්න ඕන. මීට අවුරුදු 30 කට ඉස්සෙල්ලා කුණු දැම්මේ බෙලිගහ, දංගෙදර ප්‍රදේශවල. දාලා ඉවර වෙලා පොල්ගස් හිටෙව්වා. ඒ වගේම තමයි පොල් හැදෙන්න ගත්තෙත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපිට තියෙන ප්‍රධාන ගැටලුව තමයි කසළ ප්‍රශ්නය. එතනදී එකතු කරන කුණු වලින් 15% යි ඉඳුල් එන්නේ. ඉතුරු 85% එන්නේ වෙනත් ද්‍රව්‍ය. ඒකට ක්‍රමවේදයක් සකස් කරන්න ඕන. එක්කෝ වළලන්න ඕනා. නැත්නම් ගිනි තියන්න ඕන. ඔය ක්‍රම දෙක විතරයි තියෙන්නේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ලේකම්තුමා විස්තර කරපු නරාවල, පන්නමග ඉඩමට විශාල මුදල් ප්‍රමාණයක් යෙදෙව්වා. බැකෝ යන්ත්‍රයක් කුලී පදනම මත අරගෙන තමයි පස් කපලා ගිහින් ඒ වැඩේ කරේ. පස් කියුබ් 30 ක් විතර කලින් එයා මට්ටම් කරගෙනත් තියෙනවා. ප්‍රදේශවාසීනුත් කැමතිනම් ඒ ප්‍රදේශයේ ඉඩම්වලට හානියක් වෙන්නෙත් නැත්නම් ඒකට එක නිලධාරියෙක් විරුද්ධ වුනා කියලා මේක නවත්වන්න බෑ. එයා විරුද්ධ වෙන නිර්ණායක ඉදිරිපත් කරන්න ඕන. ඉඩම් හිමියා කැමතිනම්, ප්‍රදේශයේ ජනතාව කැමතිනම් ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීවරු කැමතිනම් සභාව ඒකමතිකව තීන්දුවක් ගමු තාවකාලිකව මේ ප්‍රශ්නය විසඳන්න. ඉදිරියේදී කුණු ලබා ගන්න කොටම ප්‍රදේශයේ ජනතාව දැනුවත් කරන්න ඕනේ. ඔක්කොම කුණු කවලමේ ගත්තම තමයි අපිට ඒ ගැටලුව එන්නේ. එක තැනකට ගෙනල්ලා කුණු ටික එක වාහනේකට පටවලා මොන්රෝවියා වත්තට යවන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් වීදුරු මිලදී ගන්න, ප්ලාස්ටික් මිලදී ගන්න, කාඩ්බෝඩ් මිලදී ගන්නා තැන් තියෙනවා. ඒවා මිලදී ගන්නා තැන්වලට යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- දැනට තියෙන්නේ ෂොපින් බෑග් තමයි ප්‍රශ්නය. ප්ලාස්ටික්, වීදුරු තියේ නම් මොකක් හරි කරන්න පුලුවන්. මාලුන්ගේ ඔලු, කොරපොතු, මස්, බඩවැල් ඒවා ඉඳුල් විදියට ගන්නේ නෑ. දිරාපත්වෙන ඉඳුල් විතරයි ගන්නේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කලින් සභාවක ව්‍යාපෘතියක් මම ඉදිරිපත් කරා. දැන් මාස 06 ක් විතර වෙනවා. ඒ අයට අඩි 40 ක කන්ටේනරයක ප්‍රමාණයට වීදුරු එකතු කරලා දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- වීදුරු ගාල්ල මහ නගර සභාවට භාර දෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පොලිතින් වලටත් මේ වගේ ව්‍යාපෘති තියෙනවා. හැබැයි වෙන් කරලා ගන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අප ප්‍රාදේශීය සභාවේ කසළ බැහැර කිරීම සඳහා නරාවල, පන්නමග නානායක්කාර මහතා විසින් අප සභාවට තාවකාලිකව ලබා දී ඇති ඒ භූමි ප්‍රමාණය තවදුරටත් කසළ බැහැර කිරීම සඳහා 2019.03.18 වන දින පැවති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී අවසර ලබා දීලා තියෙනවා. එම සංවර්ධන කමිටු තීරණය අප සභාවේදී අනුමත කරලා ඒ තීරණය අනුව එම භූමි ප්‍රදේශයේ නිසි ලෙස කසල බැහැර කිරීම සඳහාත් එම භූමිය නිසි ලෙස පවත්වාගෙන යාම සඳහාත් මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව ස්ථිර කරනවා. කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදියට මම ස්ථානීය පරීක්ෂණයක් සිදු කරා. කිසි ගැටලුවක් නෑ මොන නිලධාරියා විරුද්ධ වුනත් ඒ කාර්යය කළ යුතුයි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගිය සම්බන්ධීකරණ කමිටුවට මමත් සහභාගි වුනා. අපේ ලේකම්තුමා සම්බන්ධීකරණ කමිටුව දැනුවත් කළා මේ කසළ බැහැර කිරීමට එක නිලධාරියයි විරුද්ධ වෙන්නේ කියලා. විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා මේක පොදු කාරණයක් සේ සලකලා ඒ නිලධාරියාට ඕන විදියට නෙමෙයි ඒ අවශ්‍ය විදියට ක්‍රියාමාර්ග ගන්න කියලා උපදෙස් දුන්නා. ඇත්තටම ස්තුතිවන්ත වෙන්න ඕනේ විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට අපේ සභාව වෙනුවෙන් එතුමා කතා කලා. ඒ ගැන ස්තුතිවන්ත වෙනවා මම මේ අවස්ථාවේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඊයේ මමයි, සුගත් මන්ත්‍රීතුමයි, කියාස් මන්ත්‍රීතුමයි ඊ-පරිගණක පුහුණුව සඳහා සහභාගි වුනා. ඒ නිසයි මට සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වෙන්න නොහැකි වුනේ. මම දුරකථනයෙන් විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාට කතා කලා. කතා කරලා කිව්වා මේ ප්‍රශ්නය තමයි මට මූලික වශයෙන් තියෙන්නේ කියලා. ලේකම්තුමා මග යනවා එතකොට හිරිඹුර හරියේ. මම ඒ පාර ලේකම්තුමාට කොල් කරලා කිව්වා මේ සම්බන්ධ ලියකියවිලි ටික නැවත සභාවට ඇවිත් අරන් යන්න කියලා. විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රිතුමාට මම ස්තුති වන්ත වෙනවා මේ සම්බන්ධව සහයෝගය දක්වපු එක ගැන. ඒ පිළිබඳව ක්‍රියාත්මක වීම හා සම්බන්ධීකරණ කමිටුවේදී ඒ අවශ්‍ය තීන්දු තිරණ ගැනීම සම්බන්ධයෙන්. අපිට දේශපාලන මතය කුමක් වුනත් සභාවේ පරිපාලනයට සහයෝගය දෙන තීන්දු වලට අපි ස්තුති වන්ත වෙනවා.

02. විශ්ව මිතුරු අවුරුදු උදානය 2019 සහ ගාලු ආ වසන්තය 2019 (සී. ජී. හෙට්ටිආරච්චි මයා, ලේකම්, ලබුදුව විශ්ව මිතුරු සංසඳය)

මට මතකයි මම මන්ත්‍රීවරයෙක් වෙලා ඉන්න කොට 2010 දී වගේ උසස් තාක්ෂණ ආයතනය අසල දැනට සභාව සතු ක්‍රීඩාංගනය තිබුනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ. ඉල්ලීමක් තිබුණා ඒක පොදු ක්‍රිඩාංගනයක් බවට පත් කරන්න. මේ සංගමයේ උදව් ඇතිව තමයි උසස් තාක්ෂණ ආයතනය අසල තිබුණ මේ ක්‍රීඩාංගනය පොදු ක්‍රීඩාංගනයක් බවට පත් කරන්න හැකි වුනේ. පියසේන ගමගේ හිටපු ඇමතිතුමා හදපු ගොඩනැගිල්ලට මේ ක්‍රීඩා භූමියෙන් ඉඩ ගන්න තමයි සූදානම් කරලා තිබුණේ. මම ගමේ අය එක්ක එකතු වෙලා ඒකට විරෝධය දැක්වුවම මට ඒකෙන් අයින් වෙන්න කියලා පියසේන ගමගේ හිටපු ඇමතිතුමා කිව්වා. මේ සංගමය මැදිහත්වීම මත තමයි අද ඒක පොදු

ක්‍රීඩාංගනයක් බවට පත්වුනේ. ප්‍රාදේශිය ලේකම්තුමා අපිට ඉඩම පවරපු ලිපියෙත් සඳහන් කරලා තියෙනවා මේ අය ක්‍රීඩා භූමිය නඩත්තු කරනවා, පරිහරණය කරනවා ඒ නිසා ඒ අයට විශේෂ අවස්ථාවක් ලබා දෙන්න කියලා. දැන් අපි සභා තීන්දුවක් ගමු මෙම සංගමයේ තියෙන උත්සව කටයුතු වලට මෙම ක්‍රීඩාංගනය නොමිලේ ලබා දෙන්න කියලා. මම දකින්නේ ඒක සාධාරණයි කියලා. පසුගිය කාලේ විදුලි බිල්පත්, ජල බිල්පත් පවා ගෙවලා තිබුනේ ඒ අය. මම දකින්නේ මේ කාරණා දෙකට විතරක් නෙමෙයි. කාරණාවෙන් කාරණාවට සභා තීන්දු ගන්නවට වැඩිය මේ සංගමය සඳහා ක්‍රීඩා භූමිය නොමිලේ ලබා දෙන්න අවශ්‍ය උත්සව කටයුතු වලට.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එදා ඒ ක්‍රීඩාපිටියේ ප්‍රතිසංස්කරණ කටයුතු කරද්දි මෙම සංගමය ලබා දීපු දායකත්වය අති විශාලයි. මේ නිසා මේ ක්‍රීඩාංගනය ඔවුන්ගේ උත්සව වලට, වෙනත් කාරණා වලට නොමිලේ ලබා දෙන්න කියලා මම යෝජනා කරනවා.

ඒ වගේම තමයි ඒ ක්‍රීඩාපිටියේ නවීකරණ කටයුත්තක් වුනානම් වුනේ පහුගිය රජය සමයේ. පියසේන ගමගේ හිටපු ඇමතිතුමා ක්‍රීඩාපිටියට අයිති භූමියත් අරගෙන තමයි අර තට්ටු ගාණක ගොඩනැගිල්ල හැදුවේ. අපි ඒකට තරයේ විරුද්ධ වුනා. ගොඩනැගිල්ල හදන්න ඕන තරම් ඉඩ තිබුණා උසස් තාක්ෂණ ආයතනය පිටිපස්සේ භූමියේ. නමුත් අපි එක්කත් ලොකු ආරවුලකට ඇවිල්ලා ඒ ගොඩනැගිල්ල හැදුවේ ක්‍රීඩාපිටියෙම. ඒකෙන් ක්‍රීඩාපිටියට තිබුණ ඉඩ ගොඩක් අඩුවුනා. එතුමා හිතුවක්කාරි ලෙස කරපු ඒ වැඩේ ගැනත් දැනුවත් කරන්න ඕන. මේ සංගමයට ඉදිරියේදී ක්‍රීඩා උත්සව, අවුරුදු උත්සව වැනි කටයුතු සඳහා ක්‍රීඩාපිටිය නොමිලේ ලබා දෙන්න මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මම හිතන්නේ සභාපතිතුමනි, ඒ සංගමයට විතරක් මේ ක්‍රීඩාපිටිය නොමිලේ ලබා දෙන්නේ නැතුව ඒ කොට්ඨාශය තුල පවතින උත්සව වලට නොමිලේ ලබා දෙන්න. ඒ කොට්ඨාශය තුළ යම් කිසි සමිතියක් මගින් ඉල්ලීම් කරොත් ලබා දෙන්න. ඒ පිට්ටනිය බලා ගන්නේ, ආරක්ෂා කරන්නේ ඒ මිනිස්සු තමයි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම සංගමයට ඒ භාර දුන්නොත් ක්‍රීඩාපිටියට වගේම, ක්‍රීඩා මණ්ඩපයටත් විශාල ආරක්ෂාවක් ලැබෙනවා. කොට්ඨාශයටම දුන්නොත් ඒක රැකෙයි කියලා පොඩි අවිනිශ්චිතතාවයක් තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, ඒ ක්‍රීඩාපිටියේ තියෙන ක්‍රීඩා මණ්ඩපය පවා හැදුවේ මේ සංගමයේ අයගේ මුදල් වලින්. මම හිතනවා මේ ක්‍රීඩා පිටිය ලබුදූව කොට්ඨාශයේ සමිති සංගම් වලට නොමිලේ ලබා දීම සුදුසුයි කියලා. ඒක නිවැරදි තීන්දුවක් කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ වගේම මේකට සංශෝධනයක් ගෙනාවොත් හොඳයි කියලා හිතෙනවා ගරු සභාපතිතුමනි, ක්‍රීඩා සහ උත්සව කටයුතුවලට ඇරුනම සංගීත සංදර්ශන වලට විනෝද බදු අය කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ විනෝද බදු අය කිරීම කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මේ කාරණය පිළිබඳව මාත් එක්කත් සාකච්ඡා කරා. ඉල්ලලා තියෙන්නේ ලබුදූව විශ්ව මිතුරු සංසදය. ක්‍රීඩා සමාජය නෙමෙයි. ලබුදූවේ ක්‍රීඩා සමාජයේ නම සුමුදු ක්‍රීඩා සමාජය.

මේ ගැටලුව මතුවුනේ ප්‍රාදේශීය සභාවට ක්‍රීඩාංගනය පවරාගැනීමත් සමග. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව ක්‍රීඩාංගනය තියෙන කොට එයාලා මුදල් අය කළේ නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අවසර ඉල්ලුවහම ප්‍රාදේශීය ලේකම්තුමා ඒකට අවසර දුන්නා. ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමත් සමග සභාවට දාලා සාකච්ඡා කරලා තීන්දු තීරණ ගන්න වුනා. මේක පොදු

සමිතියක්. කාගෙවත් සුබ විහරණ වලට කැපවෙන සමිතියක් නෙමෙයි. ඒ නිසා ඒ ක්‍රීඩාපිටිය නොමිලේ ලබා දීම සම්බන්ධව මගේ එකඟතාවය පළ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපි ඒකට සීමාවක් දාගන්න ඕන. ඒ කොට්ඨාශයේ සමිති සමාගම් වලට විතරක් ලබා දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ ක්‍රීඩාසමාජ හා යෞවන සමාජ 44 ක් තියෙනවා. මේ සමාජ ශක්තිමත් නෑ. රජයෙන් ලැබෙන යම් ප්‍රතිපාදනයක් හරහා තමයි මේවා ක්‍රියාත්මක වෙන්නේ. ඒ නිසා ලබුදූව ක්‍රීඩා පිටිය විතරක් නෙමෙයි ප්‍රාදේශීය සභාව සතු ක්‍රීඩාංගන සියල්ල යෞවන සමාජ හා ක්‍රීඩා සමාජ වල කටයුතු වලට නොමිලේ ලබා දෙන්න. ඒ ගොල්ලෝ ලාභ හොයන කටයුතු කරන්නේ නෑ. සංගීත සංදර්ශන වලට විනෝද බදු මුදල් අයකර ගැනීම සාධාරණයි. හැබැයි ක්‍රීඩා උත්සව වගේ කටයුතු වලට කලිනුත් නොමිලේ ක්‍රීඩාංගනය ලබා දුන්නා. ඒක මම හිතන්නේ සභාව තීන්දු නොකර සභාපතිතුමා තීරණය කරලා ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේ වෙනස් යෝජනාවක්. අපි පටලව ගන්න නරකයි. දැන් මේක සම්බන්ධව අපි තීන්දුවක් ගමු. ලබුදූව උසස් තාක්ෂණ විද්‍යාලය අසල අප ප්‍රාදේශීය සභාවට අයිති පොදු ක්‍රීඩාංගනය ලබුදූව කොට්ඨාශයේ පොදු සංවිධාන වලින් සංවිධානය කරනු ලබන උත්සව සඳහා නොමිලේ ලබා දෙන්න මම යෝජනා කරනවා. විනෝද බදු මුදල් අයකරන ඒවාට අපි අයකරනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

සභාව සතු අනෙකුත් ක්‍රීඩාංගන වල පවත්වන යෞවන සමාජ, ක්‍රීඩා සමාජ වල උත්සව වලට එම ක්‍රීඩාංගන නොමිලේ ලබා දෙන්න පුලුවන්. අපිට ඒකට ඉල්ලීමක් කරන්න කියන්න. මොන දේ තිබුණත් ක්‍රීඩාංගනයේ, සභාව දැනුවත් විය යුතුය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** වෙළඳ සැණකෙලි තියෙනකොට ආදායමක් උපයනවා. ඒකට විනෝද බදු මුදල් අය කළ යුතුය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- බොහෝ දෙනෙක් කැමති යෝජනාවක් තියෙනවා.

03. නාගරික අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳව සම්මන්ත්‍රණය සම්බන්ධවයි. (දෙවන කණ්ඩායම) (ජයනි ගුණරත්න මිය, යාරල් රීසයින් පුද්ගලික සමාගම)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** රුපියල් පනස්දාහක් තිබුණම සතියක් විතර ඉන්දියාවේ ඉඳලා එන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මීට කලින් සම්මන්ත්‍රණයක් ආවා ඒකත් දවස් දෙකයි. රුපියල් එක් ලක්ෂ දහ දාහයි. මේක එක් ලක්ෂ අසූ පන්දාහයි. ඒක දැනුවත් වීම සඳහා තමයි ඉදිරිපත් කරේ. අපි සාමාන්‍යයෙන් සභාවේ ආර්ථිකය ස්ථාවර වෙනකම් විදේශ රටවල සම්මන්ත්‍රණ වලට සහභාගි වෙන්නේ නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 04. මාර්ගයක් මැනුම් කටයුතු සිදු කිරිම සඳහා මිනින්දෝරු මහතෙකුගේ සහය ලබා ගැනීම. (ගාල්ල, කිතුලම්පිටිය, උදාර පෙදෙසේ ගම්වාසීන්)

මේ පාර දැනට සභාව මගින් කුලී පදනම මත ලබා ගනිපු එක්ස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගෙන කපා ගෙන යනවා. නමුත් මුල් හරිය අඩි 24 ක් වුන පාර ඇතුලට යනකොට අඩි 09 ක් 10 ක් විතර ප්‍රමාණයක් තරමට පටු වෙලා.

ඒකට සභාව මැදිහත්වෙලා සභාවේ මුදලින් පාර මැනලා දෙන්න කියලා තමයි කියන්නේ. ඒක වටිනවා.

කිතුලම්පිටිය, යක්දෙහිවත්ත, අතුරු මාර්ගය සභා අරමුදලින් ගෙවීම් කර මිනින්දෝරුවෙකු ලවා මැන වෙන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා මේ පාර විතරක් නෙමෙයි මීට ඉස්සර මේ සම්බන්ධව යෝජනාවකුත් තියෙනවා. අපේ තියෙන පාරවල් ටික මැනලා වෙන් කරන්න. මූලන ජනපදය උදාහරණයකට ගන්න. ඒ පාරවල්වල තිබිය යුතු පළල නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- නාගරික සංවර්ධන අධිකාරියට පැවරීමක් කරලා තියෙන්නේ මේ ඉඩම් ටික මනින්න. නමුත් තාම ඒක කෙරුනේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ පාර විතරක් නෙමෙයි සභාපතිතුමා විශේෂයෙන්ම වෙන්දේසි ඉඩම්වල පාරවල් ටික මනින්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේක ඉස්සෙල්ලා ආපු යෝජනාවනේ. මේක සම්මත කරගෙන ඉමු.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(තේ පානය සඳහා සභාව කල්තබන ලදී)**

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, පොඩි දෝෂාරෝපණයක් කරන්න තියෙනවා. උදෑසන ආහාර වේල සම්බන්ධව. ඒ ආහාර දෙනකොට මන්ත්‍රීවරියන්ටත්, මන්ත්‍රීවරුන්ටත් පරීක්ෂා කරලා දෙන්න.

අපිට උදේ මේ සභාවේ ලියුමක් තියලා තිබුණා. " නීතිය, දේශපාලනය හා රාජ්‍ය පාලනය පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව" ඒකේ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.01.19 මේ වෙනකොට ඒකේ කාලය ඉක්මවලා ගිහිල්ලා තියෙන්නේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඔබතුමා ඒ පාඨමාලාවට සහභාගි වෙනවා නම් අපි කතා කරලා ඒකට අවස්ථාවක් අරගෙන දෙන්නම්.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා මට ඉල්ලීමක් කරන්න තියෙනවා. අපි සභා ගර්භයෙන් නික්ම යන නිසා. අපිට තියෙන ප්‍රශ්නයක් පිළිබඳව කතා කරන්න අවස්ථාව ලබා දෙන්න පුලුවන්ද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔව් පුලුවන්.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** සභාපතිතුමා බටුවන්තුඩාව පාර සංවර්ධනය කරලා තිබුණා. මම බලන්න ගියා. ඉතුරු වැඩ කටයුතු සභාවේ අරමුදලින් කරලා වැඩ අවසන් වුනාට පස්සේ ගම්පෙරලිය වැඩ සටහන යටතේ ලැබෙන රුපියල් ලක්ෂ දහයෙන් පාරේ ඉතුරු වැඩ ටික කරන්න එකඟතාවයකට එන්න මම කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි මම එදා කිවුවේ.

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** දැන් ඒ වැඩකටයුතු ඒ ආකාරයෙන් කරගෙන යනවා. නමුත් මම ඉල්ලීමක් කරන්න කැමතියි ඉදිරියේදී සංශෝධනය වුනු ගම්පෙරලිය සංවර්ධන යෝජනා එනවා. ඒවත් අපි සභාව සමග සහයෝගයෙන් කරන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ගම්පෙරලිය යටතේ එන යෝජනා අපි හදුනාගෙන නිශ්චිත වශයෙන් ඒ යෝජනා කරනවා කියලා තහවුරු කරගෙන අපි වැඩ කරමු. වෙන්න හිටපු මන්ත්‍රී කෙනෙක් යෝජනා 40 ක් මට ගෙනත් දුන්නා. ප්‍රායෝගිකව යෝජනා 40 ක් කරන්න බෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ සියලු සංවර්ධන කටයුතු සභාව තුළ ඇතිවුනාට පස්සේ කුණු ටික ඇදෙනවානම්, අනවසර ඉදිකිරීම් නැත්නම්, පාරවල් ටික හැදෙනවානම් ඒකේ පළවෙනි ගෞරවය එන්නේ ඔබතුමාට. අද වෙනකොට ඉතා නරක තත්ත්වයක් තියෙනවා. ඔබතුමාට තමයි ඒක විසඳන්න පුලුවන්.

ඇත්තටම රටක් විදියට විශාල වැඩ කොටසක් කරගෙන යන මොහොතක් මේ. මේ වෙලාවේදී ගම්පෙරලිය වැඩසටහනත් එක්ක නරක හැප්පිල්ලක් හැප්පෙනවා. වටරැක පහලගෙදර වත්ත පාරට ලක්ෂ අටයි ගාණක් වෙන්කරලා තියෙනවා. පාරට සල්ලි වෙන්කරලා තියෙන අතරේ තාර දාලා තියෙනවා දවසෙන්. අඟල් එකහමාරේ ගල් දාලා ප්‍රමිතියකින් තොරව පාර හදලා කියලා චෝදනා තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- වටරැක පහලගෙදර වත්ත මාර්ගය හදන්න සභා තීන්දු අරගෙන තියෙන්නේ ජනවාරි 17 වෙනි දින තිබුන මහ සභාවේ. ගම්පෙරලියට සල්ලි ආවේ ඊට පස්සේ. ඉතිං ඒ කර්මාන්ත කරනවා කියලා මට දැනුම් දුන්නේ පාරට ගල් දැම්මටත් පස්සේ. එතකොට මට කර්මාන්තය නවත්වන්න බෑ. දැන් මම කියන්නේ පාරේ ඉතුරු ටික ගම්පෙරලිය වැඩ සටහන යටතේ කරන්න කියන්න. පාරේ තව වැඩ තියෙනවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇස්තමේන්තු හදලා තියෙන්නේ මුලු පාරටමනේ

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඉතින් ඇස්තමේන්තු සංශෝධනයට යන්න පුලුවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඇස්තමේන්තු සංශෝධනයකට කොළඹ යන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙම දෙයක් තියෙනවා. ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී කණ්ඩායමක් එක්ක එකතුවෙලා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් සම්බන්ධ කරගෙන සාකච්ඡාවකට ගිහින් තමයි මේ පාරවල් හදන්න ඕන. එකක් මතක තියා ගන්න. ප්‍රාදේශීය සභාව අපේ. පාරවල් අපේ. ආණ්ඩුව ඕන කෙනෙක්ගේ වෙන්න පුලුවන්. හැබැයි සභාව අපේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ගම්පෙරලිය වැඩසටහනෙත් අඩුපාඩුකම් තියෙනවා. අද එක පාරක් කියනවා. හෙට තව පාරක් කියනවා. අපිට අද දෙන්න නිශ්චිත වැඩ පිළිවෙලක්. ගියසැරේ මට එවලා තිබුණා ලැයිස්තුවක්. දැන් කෙරෙන්නේ ඊටත් පරිබාහිර වැඩ පිළිවෙලක්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගම්පෙරලිය යෝජනා ක්‍රියාත්මක කරගෙන එන අතරතුර තමයි ඔක්තෝබර් 26 ආණ්ඩුව උදුර ගත්තේ. ඒ සිද්ධිය නිසා ගම්පෙරලිය වැඩසටහන

නැවැත්වුවා. නැවැත්තුවහම ඒ යෝජනා සියල්ල අහෝසි වුනා. ඊට පස්සේ තමයි අපිට මේක ක්‍රියාත්මක කරන්න අමාරු වුනේ. දැන් ආයෙමත් යෝජනා ගෙනල්ලා ඒවා කොළඹ යවලා ඒ යෝජනා ආවේ මේ ලඟදී. දැන් ඒ යෝජනා ටික මම සභාවට දෙන්නම්. ඔබතුමාටත් ලැබෙන්න සලස්වන්නම්. සභාවේ ඒ යෝජනා ඕන විදියකට වෙනස් කරන්න පුලුවන් නිසා ඔබතුමා ගම්පෙරලිය යෝජනා අත්ඇරලා කරන්න. ගම්පෙරලිය යෝජනා වෙනස් කරන්න කොළඹ යන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සභාපතිවරයා විදියට මම සතුටු වෙනවා ගම්පෙරලිය හරි මොන පෙරලිය හරි ඇවිල්ලා සභා බල ප්‍රදේශයේ පාරවල් සංවර්ධනය කරනවා නම්. පාරවල් සංවර්ධනය නොකෙරුනොත් පළවෙනි චෝදනාව එන්නේ මට. මම කැමතියි ඔය පාරවල් හැදෙනවානම්. නමුත් ඒක කළමනාකරණය කරන්න ඕන. ආයතන දෙකක් තියෙන්නේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයයි, ප්‍රාදේශීය සභාවයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ සංවිධායකතුමා අපිට කිවුවේ සභාව එක්ක කතාකරලා පාරවල් ගැන එකඟතාවයකට එන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- හැබැයි මන්ත්‍රීතුමා මන්ත්‍රිවරු ඕන යෝජනාවක් ගේන්න. මීට පරිබාහිර අයට සභාවේ දේවල්වලට මැදිහත් වෙන්න දෙන්න බෑ. මම සභාපති වෙලා ඉන්නකම් මන්ත්‍රීවරු ඕන දෙයක් ගේන්න. ඊට පරිබාහිර අයට බෑ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපේ ප්‍රාදේශීය සභාවට කොට්ඨාශ සංවිධායකවරු නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මට පුලුවන් සභාපතිවරයා විදියට මේ එකක්වත් කරන්න නොදී ඉන්න. අපි එහෙම කරන්නේ නෑ. ගැටුමකට යන්න ඕන නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ගම්පෙරලිය වැඩසටහන ක්‍රියාත්මක වීමේදී මමත් ගැටලු 2ක් ඉදිරිපත් කරනවා. එකක් තමයි ගොඩකන්ද සමගි මාවත සංවර්ධනය කිරීමේදි ඡන්දයට ඉදිරිපත් වුන අපේක්ෂකයෙක් ගිහිං කියලා තියෙනවා මගේ සල්ලි මට ඕන විදියට කරනවා කියලා අපේ පාක්ෂිකයෝ දෙදෙනෙකුගේ ගෙවල් 2ක් අත ඇරලා කරා.

කරාපිටිය ඉන්ග්ලන්ඩ් හිල් මාවතේ සමරවීර මහතාගේ නිවස අසල අනිවාර්යයෙන් සිලින්ඩර් 2ක් යොදවන්න ඕන. ඒක යෝජනා කරලා තියෙද්දී ඊයේ තාර දැම්මා පාරට. කොන්ක්‍රීට් ටික හරි තාර ටික හරි දාගෙන යනවා. ජලය බැසයාම ගැන අදහසක් නෑ. ඒක හින්දා තාක්ෂණ නිලධාරීන්ට ලිඛිතව දන්වන්න. මම ඒක දිගටම කිව්වා කෙරුනේ නෑ. පාරක් හදනකොට ජලය බැසයාම ගැන සැලකිලිමත් වෙන්න. ක්‍රමවේදයකට අනුව කටයුතු කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම බොහොම වගකීමෙන් කියන්නේ. මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු විසි දෙදෙනා ඇරුනම මේ සභාවේ වෙන අය නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** කලින් මම පරිසර කමිටුව නියෝජනය කරා සභිකයෙක් විදියට. ඒකෙදි අපි තීරණයකට ආවා සභාවට අදායමක් ලැබෙන විදියට වක්වැල්ලේ ඇල මාර්ගයට බෝට්ටු දාලා දේශීය, විදේශීය සංචාරකයින්ට ලබා දීලා සභාවට අදායමක් ගන්න. මම විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා එක්කත් සාකච්ඡා කරා. මන්ත්‍රීතුමා මට කිව්වේ ඒකට ඇස්තමේන්තුවක් සකස්කරලා දෙන්න කියලා. අපිට බෝට්ටුවලට කීයක් වියදම් වෙනවද කියලා

බලන්න ඕන. සභාපතිතුමා ඒකට අවසර දෙනවා නම් සභාවට අදායමක් ගන්න පුලුවන් වැඩසටහනක් ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න පුලුවන් වෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපි ඒකට නැවත පරිසර කමිටුවක් කැඳවලා සාකච්ඡා කරලා වැඩපිළිවෙලක් හදාගමු.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- සභාපතිතුමනි, අපි ප්‍රීමික්ස් ව්‍යාපෘතිය පටන් ගත්තා. එකෙන් විශාල සේවයක් අපේ බල ප්‍රදේශයට සිදු කරා. නමුත් මේ ගම්පෙරලිය වැඩසටහන එක්ක අපි දැක්කා මාටින් පෙරේරා මාවත සභාවෙන් ප්‍රීමික්ස් කරාට පස්සේ ඒ ප්‍රීමික්ස් කරපු එක වහලා පාරේ පොඩි කොටසක් සංවර්ධනය කරා. උප සභාපතිතුමාගේ කොට්ඨාසයේ තියෙන බැදි පාර උදේ ප්‍රීමික්ස් කරා. හවස කොන්ක්‍රීට් දාලා. මේවා ජනතාවගේ සල්ලි. අපරාදේ ඒ මුදල්. ඒ වගේ කටයුතු කරන්න දෙන්න එපා. ඒ ගැන අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ප්‍රීමික්ස් ව්‍යාපෘතියෙන් පාරවල් හොඳට සකස් කරලා තිබුනා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගිය මහා සභා රැස්වීමේදී අපිට ගම්පෙරලිය වැඩසටහනෙන් කරන පාරවල් ගැන සවිස්තර විස්තරයක් දුන්නනේ. එතකොට ඇහුවා මේ මාර්ග ලැයිස්තුවේ පාරවල් ප්‍රීමික්ස් ව්‍යාපෘතියට හෝ සභාවෙන් හදන්න යොමුකරලද කියලා. එතනදි ගැටලුව ඇතිවුන එකම මාර්ගය තමයි සේරියගොඩ මාර්ගය. කපුහෙම්පල බැදිපාර ගැනවත්, මාටින් පෙරේරා මාවත පිළිබඳවත් එහෙම ගැටලු මතුවුනේ නෑ.

දැන් මගේ කොට්ඨාසයේ මාර්ග කීපයක් තිබුනා. මම ඒ යෝජනා ටික බලලා ඒ යෝජනාවල නැති මාර්ගයක් බලලා ප්‍රීමික්ස් කර ගත්තා. ඒක සාර්ථකයි. ප්‍රීමික්ස් ව්‍යාපෘතිය හොඳයි. එතකොට මේ ගැටලුව ඇවිත් තියෙන්නේ මේ ලැයිස්තුවයි, මන්ත්‍රීවරුන්ගෙයි තිබුණ සම්බන්ධතාවය අඩුවුන නිසා.

ඊගාවට මේ ප්‍රශ්නය වඩාත්ම උග්‍ර වෙන්න හේතුව තමයි සම්බන්ධීකරණ කමිටුවේ මහජන නියෝජිතයින්ගේ සහභාගීත්වය අහෝසිකිරීම. දැන් මීට පෙර මේ මාර්ග ලැයිස්තුව හදලා සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරා. ඉදිරිපත් කරාම මගේ කොට්ඨාසයේ මාර්ග තුනක් තිබුනා. එම මාර්ග තුන මම සඳහන් කරගෙන ආවා. නමුත් දැන් සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරන්නේ කුඩා පක්ෂ වලින් එක්කෙනයි. අපේ පක්ෂයෙන් දෙන්නයි. එක්සත් ජාතික පක්ෂයෙන් දෙන්නයි. අපේ මන්ත්‍රීවරු විසිදෙදෙනා වෙනුවෙන් නියෝජනය වන සංඛ්‍යාවේ අඩුවක් තිබෙනවා. ගරු ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගේ සම්පූර්ණ බලය යොදවලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට මහජන නියෝජිතයන් විදියට මන්ත්‍රීවරුන්ට සහභාගීවෙන්න තිබුණ අවස්ථාව නැති කරා ගැසට් නිවේදනයක් මඟින්. එහෙම කරපු නිසා මෙහෙම ගැටලු ඇතිවෙනවා ප්‍රාදේශීය වශයෙන්. ඒකට අපි එදා විරුද්ධවුනා. අද ඒකේ ප්‍රතිඵල අපි භුක්ති විඳිනවා. අපි කව්රුත් සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරානම් ඒ ලැයිස්තු අපිට හම්බවෙනවනේ. මේ ගැටලු කිසිවක් ඇතිවන්නේ නෑ එහෙම නම්. එකෙන් තමයි මේ ප්‍රශ්නය ඇතිවෙලා තියෙන්නේ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මේ කාර්යය අද බොහොම වැරදි පැත්තකට ගියේ අපේ චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා සඳහන් කරපු කාරණය නිසා තමයි. වෙනදා සම්බන්ධීකරණ කමිටුව කිව්වම අපි ගම නියෝජනය කරලා ගමේ ගැටලු, ප්‍රාදේශීය සභාවේ යෝජනා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යෝජනා එදා අපි බොහොම පැහැදිලිව සාකච්ඡා කරලා තීන්දු තීරණ ගත්තා. අද අපිට මහජන නියෝජිතයෝ විදියට ගමේ ප්‍රශ්න කතාකරන්න තිබෙන තැන නැති කරලා තිබෙනවා. අපි දන්නේ නෑ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදුවෙන සංවර්ධන කටයුතු මොනවද කියලා. ප්‍රාදේශීය සභාවෙන් සිදුකරන සංවර්ධන කටයුතු ඒ නිසා ඒවත් එක්ක ගැටෙනවා. ඒ නිසා එකේ වැරැද්ද වුනේ පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යංශය ගනිපු තීන්දු නිසා. මේකට අපි විරුද්ධවුනා. අද ගමේ නියෝජනයක් නෑ මේකට. අපිට සංවර්ධන යෝජනා ගොඩක් තියෙනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව ඊයේ තියෙනවා කිව්වම මම ඇහුවා ඇයි අපිට දැනුම් දුන්නේ නැත්තේ කියලා. ගම්වල තියෙන අපේ යෝජනා එකතු කරගෙන එනවා අපිට කිව්වා නම් කතා කරන්න. ඒ අවස්ථාව නැති කරලා තියෙනවා. මේ රජය ගමට නියෝජනයක් ගෙනැල්ලා

මන්ත්‍රීවරු පත්කරලා මන්ත්‍රීවරු ගෙදර තියලා එයාලා සම්බන්ධීකරණ කමිටුවේදී තීන්දු තීරණ ගන්නවා. කොච්චර වැරැද්දක්ද ඒක. මේ ක්‍රමය නිසා තමයි සංවර්ධන කටයුතුවලදී නොයෙක් අපහසුතාවයන්ට පත්වන්නේ. අපේ සභාවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එකට යන්න නම් සම්බන්ධීකරණ කමිටුවට ගමේ නියෝජනය තියෙන්න ඕන. ප්‍රාදේශිය මහජන නියෝජිතයින්ගේ යෝජනා සාකච්ඡා කරන්න ඕන. මේ ගැටලුව හැමදාම ඉස්සරහට යනවා නැත්නම්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** උප සභාපතිතුමා කියපු කාරණයේදී ඇත්තටම පහුගිය ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සියලුම මහජන නියෝජිතයින් සම්බන්ධ වුනා. නමුත් මේ ළඟදී ඉඳලා පක්ෂ නියෝජිතයින් පත්කරන්න හේතුවුනේ රටේ පවතින වර්තමාන තත්වය අනුව. සම්බන්ධීකරණ කමිටුවක් පත්වුනාම ප්‍රදේශය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රිවරු වගේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු සහභාගීවුනා. සංවිධානාත්මකව ඇවිල්ලා සම්බන්ධීකරණ කමිටුව පවත්වාගෙන යන්න බැරිවෙන්න ක්‍රියාත්මකවුනා. අපේ බෝපෙ පෝද්දල සම්බන්ධීකරණ කමිටුවේදී නෙමෙයි යම් යම් සම්බන්ධීකරණ රැස්වීම්වල තීන්දු තීරණ ගන්න බැරි ආකාරයකට පත්වුනා. ඒක නිසා තමයි ආණ්ඩුවෙන් තීන්දුවක් ගත්තේ එක් එක් පක්ෂවල නියෝජිතයින් පත් කරන්න. ඒ නියෝජිතයන් හරහා යෝජනා ඉදිරිපත් කරන්න පුලුවන්. එහෙම නැතුව වෙන මොකක්වත් නෙමෙයි. ඒක කරන් යන්න බැරි තත්වයක් ආවා. වාඩිවෙන්න ඉඩ දෙන්න බැරි විදියේ තත්වයක් ආවා. සභාපතිතුමාටයි, නියෝජිතයින්ටයි පුලුවන් යෝජනා ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම දැක්කේ අපේ සභාව විදියට කරන්න දෙයක් තියෙනවා. දෙයක් කෙරෙන්න නම් ඉල්ලීමක් එන්න ඕන. බලපෑමක් එන්න ඕන යම්කිසි විදියකින්. මම මේ දෙකටම ඇහුම්කන් දුන්නා. මේ දෙකේම සත්‍යතාවයක් තියෙනවා. මගේ මතය නම් මොන ආරවුල තිබුණත් සියලුම මන්ත්‍රීවරුන්ට එතන නියෝජනය කරන්න දෙන්න ඕන. එකේ බොහොම පැහැදිලි හේතුව තමයි පසුගිය සම්බන්ධීකරණ රැස්වීමට සභාපතිතුමාට සහභාගී වෙන්න වුනේ නෑ පුහුණුවකට ගිය නිසා. ලේකම්තුමා තමයි සහභාගීවුනේ. අපේ පක්ෂයෙන් යනවා නියෝජිතයෝ. අනිත් පක්ෂවලිනුත් යනවා නියෝජිතයෝ. දැන් මේ අපි ඉදිරිපත් කරන ප්‍රශ්න කතා කරනවද එතන. කරන්නේ නෑ. මම යෝජනාවල් ගණනාවක් දැම්මා. නමුත් යන්නේ නෑ. මම දන්නේ නෑ ඉඩකඩ හම්බවෙනවද නැද්ද කියන්න. මෙතන විතරයි තියෙන්නේ හරියට නිලධාරීන් අරගෙන මෙයාලා කරන වැරදි ගැන ලැජ්ජ කරලා හරි තීන්දු තීරණ ගන්න. ලංකාවටම මේක ප්‍රශ්නයක්.

උදාහරණයකට පතල් හා භූ විද්‍යා කාර්යාංශය, නාගරික සංවර්ධන අධිකාරිය ගන්න. මේ ආයතන දෙක ඉතාම දූෂිත ආයතන දෙකක්. දැන් ඔබතුමාලා අපි මේ පටලැවිලි හදාගන්නේ ඇයි. වැරදි දෙයක් දෙන්න හදනකොට පතල් හා භූ විද්‍යා කාර්යංශය කියනවා නම් මේක සුදුසු ඉඩමක් නෙමෙයි, මේකට අවසර දෙන්න බෑ කියලා මේ මන්ත්‍රීවරු කිසි කෙනෙක් මේකට ගැටෙන්න ඕන නෑ.

මේ සභාවේ යෝජනාවක් කරන්න ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට සියලුම මන්ත්‍රීවරුන්ට සහභාගී වෙන්න අවස්ථාව දෙන්න කියලා. ඒක ලිඛිතව කරන්න. ඔබතුමාලා දන්න අනෙක් සභාවලටත් කියන්න මේ දේ කරන්න කියලා. අපි විසි දෙදෙනාටම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරන්න දෙනවා නම් ගැටලුවක් නැනේ. ප්‍රශ්න එනවා නම් ඒවාට මුහුණ දෙන්න ඕන. දේශපාලඥයෝ වුනාම ප්‍රශ්න වලට මුහුණ දෙන්න පුලුවන් වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ ගැන මමත් අදහස් දක්වන්නම්. ප්‍රේමලාල් අබේසේකර මන්ත්‍රිතුමාගේ යෝජනාව හොඳයි. අපි මන්ත්‍රීවරු සියලුම දෙනාම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව නියෝජනය කරන්න ඕන. කරාපිටිය කොට්ඨාසය ගත්තම මට වගේම ලියනගේ මන්ත්‍රීතුමාටත් ප්‍රශ්න තියෙනවා. හැම මන්ත්‍රීවරයෙකුගේම කොට්ඨාසවල ප්‍රශ්න තියෙන්න පුලුවන්. ඒක අනිත් මන්ත්‍රීවරයාට වඩා පැහැදිලිව විග්‍රහ කරන්න පුලුවන් වෙන්නේ ප්‍රශ්නය තියෙන මන්ත්‍රීතුමාට. එතනදී අනිත් මන්ත්‍රීතුමා ගිහින් මේ ප්‍රශ්නය කතා කරන්න ගියාම ඒ මන්ත්‍රීතුමා දන්නේ නෑ එකේ අගක් මුලක්. ප්‍රශ්නය අදාළ මන්ත්‍රීවරයා ගියාම ඒ සම්බන්ධව තියෙන කරුණු ඉදිරිපත් කරලා අදාළ නිලධාරීන් එක්ක සාකච්ඡා කරන්න අවස්ථාව තියෙනවා. මම

හිතන්නේ මෙතනදි අපේ මන්ත්‍රීවරු, මන්ත්‍රීවරියන් සියලුම දෙනාම එදා හිටියා වගේ ඉන්නවා නම් මේක සාර්ථක කර ගන්න පුලුවන් කියලා. ඊයේ සම්බන්ධීකරණ කමිටුවේදි අපි දැක්කා සමහර දේවල් ගැන නිලධාරීන් දැනුවත් නෑ. උදාහරණයක් විදියට පෙර පාසල් ගත්තම පෙර පාසල් නියෝජනය කරන නිලධාරිනිය දන්නේ නෑ සුපෝෂ බෙදීම සම්බන්ධව. ඒ නිලධාරිනියගෙන් ඒ ගැන ඇහුවම ඒ නිලධාරිනිය දන්නේ නෑ. ඔහොම සම්බන්ධීකරණ කමිටුවක ක්‍රියාමාර්ග ගන්න පුලුවන්ද කියලා ගැටලුවක් තියෙනවා. ඒ හින්දා මම කියන්නේ මේ හැමෝම සම්බන්ධ කරගත්තම මීට වඩා හොඳට සම්බන්ධීකරණ කමිටුව කරගෙන යන්න පුලුවන්. ඒකයි මගේ හැඟීම.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මේ සභාවේදී අපි තීන්දුවක් ඒකට අරගමු.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සම්බන්ධීකරණ කමිටුවට අප ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීවරුන්ට සහභාගීවීමේ අවස්ථාව ලබාදිය යුතුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය.)

(ගරු මන්ත්‍රිනී එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය, ගරු මන්ත්‍රිනී ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය, ගරු මන්ත්‍රිනී පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය, ගරු මන්ත්‍රිනී කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය හා ගරු මන්ත්‍රිනී ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 05. නිවසට යාම සඳහා ආඳා දොළ හරහා පාලමක් ඉදිකිරීම (කේ.කේ. සේනාරත්න මයා, අංක 93, මාම්පිටිය, ගාල්ල)

මේකට සභා තීන්දුවක් ගමු ඉදිකරන්න කියලා. මම එයාට කිවුවා පිටින් මුදල් ගේන්න  කියලා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මේකට වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් අවසර ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අදාළ ආයතන වල අනුමැතියට යටත්ව ඉදිකරන්න. මම එයාව දැනුවත් කළා බාහිරින් මුදල් ගේන්න කියලා මේ වැඩේට.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- වක්වැල්ල පාරේ එස්. ඕ. එස්. ළමා ගම්මානය පහුකරගෙන යන කොට මේ වගේ පාලම් දිගටම හදලා තියෙනවා. අන්න ඒ වගේ ප්‍රධාන මාර්ගයේ ඉඳන් නිවසට යන්න පාලමක් දාලා දෙන්න කියලානේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-**  මේ වගේම නාවින්න ප්‍රදේශයේ පාලමක් හදන්න ගියාම කිව්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අවසරය අවශ්‍යයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපි සභා තීන්දු අරගමු අවශ්‍යය කටයුතු ටික එයා කරගනීවි. ඒක කරන්න ඕනා අදාළ ආයතනවල කොන්දේසිවලට යටත්ව එයා මුදල් හොයාගෙන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය පාලම පාලම ඉදිකරන්න යෝජිත තැන ඉඩම් ආරවුලක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපිට ඉල්ලීමක් කරහම ඒක ප්‍රතික්ෂේප කරන්න පුලුවන්. නැත්නම් ඒක අනුමත කරන්න පුලුවන්. මේක ප්‍රතික්ෂේප කරන්න ඕන නෑ. අපි අනුමත කරලා තියමු. මේක හදන්නේ සභා අරමුදල් වලින් නෙමෙයි. නීත්‍යානුකූල තත්ත්වය ඒ අය බලා ගනිවී. වැඩ කරන්න පටන්ගන්න කොට විරුද්ධ අය ඉන්නවානම් ඒකට විරුද්ධ වෙයි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ගිහිල්ලා අවසර අරගෙන නීත්‍යානුකූලව එන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මෙම පාලම නීත්‍යානුකූලව හා අවශ්‍ය අදාළ ආයතනවල කොන්දේසි වලට යටත්ව ඉදිකිරීමට සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. ගිංගඟ මිටියාවත ප්‍රජා මූලික පරිසර කළමනාකරණ වැඩසටහන (රනිල් වික්‍රමසේකර මයා, පළාත් පාලන කොමසාරිස්, දකුණු පළාත)

ඒකට දිනයක් මම තීරණය කරලා යවලා මන්ත්‍රීවරුන්ට දැනුම් දෙන්නම්.

07. අමාත්‍ය මණ්ඩල තීරණ දැනුම් දීම, අමාත්‍ය මණ්ඩල තිරණ අංක 830 ඃ 08 (එරංගි උමංගා මැන්දිස් මෙය, පළාත් පාලන සහකාර කොමසාරිස්, ගාල්ල.)

ඒක ගැන දැනුවත් වෙන්න අපිට ආදාහනාගාරයක් නම් තාම නෑ. සභාවේ සුසාන භූමිවල වැඩිහිටි නිවාස වල ඉන්න අය මියගියහම නොමිලේ භූමිදාන කටයුතු කරන්න අවස්ථාව දෙන්න කියලා තමයි කියලා තියෙන්නේ.

08. එළඹෙන සිංහල අලුත් අවුරුදු උත්සවය වෙනුවෙන් උත්සව අත්තිකාරම් මුදලක් ලබා ගැනීම. (බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හා මන්ත්‍රීවරියන්)

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඒකත් එක්කම දැනුවත් වීමට මම අහන්නේ අනියම් පදනම මත බඳවා ගනිපු සේවකයන්ට මේ උත්සව අත්තිකාරම් ලබා දෙන්නේ නැද්ද?. ඒකට වෙන ආයතනවල නම් ස්ථිර සේවකයෝ දෙන්නෙක් ඇප විදියට අත්සන් කරනවනම් අනියම් හරි ආදේශක හරි සේවකයන්ට උත්සව අත්තිකාරම් ලබා ගන්න පුලුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ අය කොන්ත්‍රාත් පදනම මත ඉන්නේ. අපි කවුරුත් එකඟයි ඒ අයට උත්සව අත්තිකාරම් දෙන්න. ඒ ගැන තවදුරටත් කොමසාරිස්තුමාගෙන් උපදෙස් අරගන්නෙයි කියලා මම ලේකම්තුමාව දැනුවත් කරන්නම්. මේගොල්ලෝ තාම ආව විතරයි. නැවතුනොත් ගෙවන්න වෙන්නේ ඇප අත්සන් කරපු ස්ථිර සේවකයන්ට. ඒ අය ඊට පස්සේ අපේ පස්සෙන් ඒවි. මේ අය ඇවිල්ලා තාම මාස කීපයයි. ඒ අය මේක අරගෙන නැවතුනොත්, මේක අරගෙන අපිට පිටවැඩ කරන එක ලාබයි කියලා හිතුනොත් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ අය ඉල්ලන්නේ රුපියල් 10,000/- උත්සව අත්තිකාරම. ඇප අත්සන් කරන කෙනා දැනගන්න ඕන විශ්වාසය ගැන. ඔබතුමාලට චෝදනා කරන්න බෑ ඇප අත්සන් කරාට පස්සේ. ඇපකරුවන් දැනුවත් කරන්න ඕන වගකීම ඔයාලා ගන්න ඕන කියලා. පත්වීම් ස්වාභාවය අනුව දෙන්න පුලුවන් සහනයක් තියේනම් ලබා දෙන්න. සිංහල හා හින්දු අලුත් අවුරුද්දට වෙනත් වෘත්තීන්වල යෙදෙන්න බෑ. මේ වෙලාවේ ඇඳුමක් ළමයින්ට අරන් දෙන්න, කැවිලි ටිකක් හදා ගන්න ඕන. දෙන්න පුලුවන් සහනයක් තියේ නම් ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ අය අවුරුද්දක සේවා කාලයකට යටත්ව බඳවා ගත්තේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පරිවාස කාලය අවසන්වුන ස්ථිර සේවකයින් දෙදෙනෙකුගේ ඇප මත අනියම්, ආදේශක කම්කරුවන්ට රු.10,000.00ක උත්සව අත්තිකාරම ලබා දෙන්න පුලුවන් කියලා පළාත් පාලන කොමසාරිස්තුමා මාව දැනුවත් කරා. මන්ත්‍රීවරුන්ට රු.25,000.00ක උත්සව අත්තිකාරමක් ලබා දෙන්න බෑ කිව්වා. ඒකත් ස්ථිර සේවකයින්ගේ ඇප මත ලබා දෙන්න පුලුවන්ද කියලා මම ඇහුවා. මන්ත්‍රීවරුන්ට දීමනාවක් කිව්වා ලබා දෙන්නේ. ඒ නිසා ලබාදීමේ හැකියාවක් නෑ කිව්වා.

09. දූව වත්ත මාර්ගය පිළිසකර කර ගැනීම සහ මාර්ගය මැන සකසා ගැනීම. (ලේකම්, හිතමිතුරු සුහ සාධක සමිතිය, දූව වත්ත, වක්වැල්ල, ගාල්ල.)

මේක අපි සභා තීන්දුවක් ගනිපු එකක්. ඒකට අපේ තාක්ෂණ නිලධාරි ලවා පාරේ අඩි 20 ලකුණු කරලා දෙන්න පුලුවන්.

__(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න__ ඃ- නැත

__(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා__

__ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා__

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. අප බලප්‍රදේශයේ දිරාපත් වූ වීථි ලාම්පු වෙනුවට අලුතින් විදුලි උපාංග කට්ටල 50 ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

කොට්ඨාශයට නෙමෙයි මේ පොදුවේ සවිකරන්නේ බලප්‍රදේශයට. මන්ත්‍රීවරුන්ට ලබා දීපු වීථි පහන් නිවැරදි තැන්වලට සවි වුනේ නෑ. ගිංතොට කොට්ඨාශයේ තියෙනවා දිරපු නැමි පයිප්ප කට්ටල. ඒවාට අලුතින් යොදන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අද උදේ කතා කරා ෆැකල්ටියේ ඉඳපු ඕ.අයි.සී මහත්මයා. තුන්වෙනි පාරටත් මාර්තු මාසේ ඇවිත් දාන්න කියලා තියෙනවා. බල්බ් එක පිච්චිලා මාස 03 ක් විතර වෙනවා කියලා කිව්වා. ඒක කරලා දෙන්න. පොතේ ලියලා තියෙනවා දෙපාරක්.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 02. සභාපති නිල කාමරය වායු සමීකරණ කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා. ඒවගේම ප්‍රාදේශීය සභා කාර්යාලයත් වායු සමීකරණය කරන්න කියලා මම ඉල්ලනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

__ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමාගේ යෝජනා__

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 03. සභාව සතු සමර්හට්වල රෙදි දිරාපත් වී ඇත. ඒ සඳහා අලුතෙන් රෙදි දැමීමට යෝජනා කරමි.

ප්‍රදේශයේ උත්සව වලට මේ සමර්හට් ගෙනිච්චහම අපහසුතාවයට පත්වෙනවා. ඒ වගේම සභාවේ කීර්තියටත් ඒක හානියක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඕකත් එක්කම කියන්න ඕනේ. නොමිලේ දෙන ඒවා තමයි බහුතරයක් තියෙන්නේ. වතුර පිරුණු ගමන් උඩින් අස් කරන්නේ නැතුව යටි පැත්තෙන් රෙද්ද කපලා වතුර අස්කරනවා. සභාවේ සමර්හට් යවන කොට නිලධාරියෙක් යවන්න ඕන. ඒ වගේම ගේන කොට හානිකරලා තිබුනොත් ඒකට අය කරන්න ඕන.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒ රෙද්දට පුංචි වැස්සකටත් වතුර එකතු වෙනවා. ඒ වතුර රැදෙන්නේ නැති විදියට සකස් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සභාපතිතුමා සමර්හට් නොමිලේ ලබා දෙන්නේ නැතුව අය කිරිමක් කරලා දෙන්න බැරිද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සභාව පැත්තෙන් යම් සුභ සාධනයක් කෙරෙනවා කියලා පෙනෙනවා මේකෙදී. ඒ කීර්තිය අපේ ප්‍රාදේශීය සභාවට තියෙනවා. ඒ නිසා මොකක්හරි උත්සවයක් ආවහම සභාවෙන් සමර්හට් ඉල්ලනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** උප සභාපතිතුමා කිවුවා වගේ සභාවක මේ වගේ දේවල් තියෙන්න ඕන. වරිපනම් බදු ගෙවන ජනතාවගේ සුභසාධන කටයුතු වලට මේවා අවශ්‍යය වෙනවා. මේවා රැකගැනීම සඳහා ඒ අයව දැනුවත් කරන්නත් ඕන. සමර්හට්වල රෙදි ලොකු කාලයක් පාවිච්චි කරන්න බෑ. පාවිච්චි කරන අය මේක තවත් අයෙකුට ලබා දෙන්න ඕන කියන පදනමේ ඉඳගෙන මේක ප්‍රවේශම් කරන්න ඕන. වැස්සට තෙමිලා තියෙනවානම් ඒක වේලෙනකම් ගලවන්න හොඳ නෑ. මොකද ඕක ගැලෙව්වම වේලන්න බෑ. සභාවේ කම්කරුවොත් යවලා සභාවේ වාහනෙත් යවලා ප්‍රවාහනය කරන්න. ඒ නිසා යම් කිසි මුදලකුත් අය කරන්න වෙනවා. වැඩ පිලිවෙල හොඳයි. මේවා කියන එකත් හොඳයි. මේක පාලනය කරන්න කෙනෙක් පත්කරන්න ඕන සභාවෙන්. විජේපාල මහත්තයාට මේ ඔක්කොම කරන්න බෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- හොඳම දේ ගෙනියන අයම ගේන්න ඕන. ලබා ගන්න ලිඛිත ඉල්ලීමක් කරන්න ඕන. ඒකට යම්කිසි හානියක් වුනොත් ඒ අයගෙන් අය කර ගන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 04. අප ප්‍රාදේශිය සභාවට ජාතික කොඩි සහ පළාත් කොඩි ලබා ගැනීමට යෝජනා කරනවා. අවශ්‍ය ප්‍රමාණය අනෙකුත් මන්ත්‍රීන් හා සාකච්ඡා කොට තීරණය කිරීමට යෝජනා කරමි.

අප ප්‍රදේශයේ නිදහස් උත්සවයක් වෙන්න පුලුවන්, ජාතික උත්සවයක් වෙන්න පුලුවන්. අපේ හිතවත් කට්ටිය අහනවා ජාතික කොඩියක් ගන්න නැද්ද?, පළාත් කොඩියක් ගන්න නැද්ද? කියලා අපේ සභාවෙන්. නමුත් සභාවේ කොඩි නැහැ. මොකක්හරි උත්සවයකදී කොඩි 07, 08 ක් ගන්න ප්‍රාදේශීය සභාවේ නැත්නම් ඒකෙන් වැඩක් නෑනේ. ඔබතුමාලා ප්‍රකාශ කරන්න මිලදී ගත යුතු ප්‍රමාණය. අපේ ප්‍රාදේශීය සභාවේ ඒ වගේ දේවල් තියෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක හොඳ යෝජනාවක්. අපි කොඩි කීපයක් ගමු.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මම අක්මීමන ප්‍රාදේශීය සභාවෙන් ඇහුවා. එයාලා ගාව කොඩි තියෙනවා. නමුත් පිටට දෙන්නේ නෑ. කොඩි 10 ක් බැගින් මිලදී ගන්න. මම ඒ යෝජනාවට සංශෝධනයක් එකතු කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම සංශෝධිත යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කැමතිනම් දම්පාට කොඩි, රතුපාට කොඩි, කොළ පාට කොඩි 25 ගානේ මිලදී ගන්න කියලා මම සංශෝධනයක් ගේන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පාට කොඩි තියෙනවා සභාවේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕපාත රාහුල විද්‍යාලයේ උත්සවයක් තිබුණා. සම්පූර්ණයෙන්ම කොළ පාට කොඩි දාලා තිබුණේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 05. තොටගොඩ සුගුණ මාවත හරස් මාර්ගයේ දිමුතු පෙර පාසල අසල දොළ කාණුව කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 06. කපුහෙම්පල කැරුන්විල රණවිරු මාවත හරස් මාර්ගයේ අබලන් කොටස තාර යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 07. අප බල ප්‍රදේශයේ දිරාපත් වූ වීදි ලාම්පු වෙනුවට අලුතින් විදුලි උපාංග කට්ටල 30ක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 08. සභාව සතු පුස්තකාලයේ ප්‍රමාණවත් පොත් රාක්ක නොමැති නිසා පොත් තෝරා ගැනීමේදී අපහසුතාවයට පත්වේ. අවශ්‍ය පොත් රාක්ක හෝ කබඩ් මිලදී ගැනීමට යෝජනා කරමි.

පාඨකයෝ කීප දෙනෙක්ම මාව දැනුවත් කරා. පොත් රාක්ක ප්‍රමාණවත් නොමැති නිසා ගැටලුවලට මුහුණ පානවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පුස්තකාල දෙකට ගිය අවුරුද්දේ කබඩ් හතරක් ගෙනත් දුන්නා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මට පාඨකයෝ දෙන්නෙක් කිව්වා පොත් අට්ටි දෙක ගානේ කබඩ්වල ගහලා තියෙන්නේ කියලා. පොඩ්ඩක් හොයලා බලලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 09. පලිවතුගොඩ සමෘද්ධි මාවත අවසාන කොටස තාර හෝ කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 10. කපුහෙම්පල සෞඛ්‍ය සායන ගොඩනැගිල්ල වැඩ අවසන් බැවින් නාම පුවරුවක් සවිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ඒක අපිට සභාවෙන් කිරීමට හැකියාවක් තියෙනවානේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ලබුදූව ක්‍රීඩාංගනයේ නාම පුවරුවයි, උප කාර්යාලයේ නාම පුවරුවයි තාම නෑ.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** ලබුදූව ක්‍රීඩාංගනයේ නාම පුවරුව නම් ඉක්මනට ඕන සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** කපුහෙම්පල සෞඛ්‍ය මධ්‍යස්ථානයේ ගේට්ටුව සකස් කරලා තියෙනවා. ඒක මම සවිකරලා දෙන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** බොහොම ස්තුතියි අනිල් මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා කපුහෙම්පල සෞඛ්‍ය මධ්‍යස්ථානය ගැන බොහොම උනන්දුවකින් කටයුතු කරනවා. ඒකට බොහොම ස්තුතියි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** 11. අප ප්‍රාදේශීය සභාවේ මාර්ග නඩත්තු ඒකකයට ආරක්ෂිත කබා, හිස්වැසුම්, අත්වැසුම්, පාවහන් (බූට්ස්) හා මාර්ග නඩත්තු අවස්ථාවලදී භාවිතා කිරීමට සංඥා පුවරු දෙකක් ලබා දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** මාර්ග නඩත්තු ඒකකය මම දැක්කා අපේ කොට්ඨාශයේ මාර්ග නඩත්තු කරද්දි එයාලා ආරක්ෂිත නෑ. ඒ හින්දා මාර්ග සංඥා පුවරු දෙකක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා නම ගහපු ලුමිනෙක්ස් කලර් එකෙන් ජැකට් එකක් තියෙනවා. ඒවයි අත්වැසුම්, හිස්වැසුම්, බූට්ස් ලබා දුන්නා නම් ඒක හොදයි. කොහෙන්ද කියන එකවත් අඳුර ගන්න බෑ.

12. ප්‍රධාන කාර්යාලයෙන් මාර්ග සංවර්ධන හා සුද්ධ පවිත්‍ර කිරීම් කටයුතුවලට කම්කරු මහතුන් යොදවන අවස්ථා වලදී අවශ්‍ය ආයුධ වන උදලු, අලවංගු ආදිය හා සේවක මහතුන් ප්‍රවාහනයට අත්ට්‍රැක්ටරයක් යෙදවීමට යෝජනා කරමි.

සභාවේ සේවක මහතුන් කෘෘ කැබ් රථයෙන් සේවය කළ යුතු ස්ථාන වලට යනවාද?

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔව් යනවා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එහෙමනම් ඒ යෝජනාව ක්‍රියාත්මකයි.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- 13. කන්දේගොඩවත්ත ගම්මානයේ පාවිච්චියට නොගන්නා පොදු ළිඳ ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒකට තාක්ෂණ නිලධාරි වාර්තාවක් අරගෙන ඉදිරි කටයුතු කරමු. ඒ ඉඩම අල්ලගන්න එකට මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- ඒ ඉඩම් කෑල්ල පාරට ගන්න යෝජනා කරලා තියෙනවා. පාර අඩි 08 ට පළල් වෙනකොට පාර හරවන්න පුලුවන් මේ ඉඩම් කෑල්ල හරහා.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපේ කට්ටියත් වතුර ලයින් එක ගම් වලට එනකොට ළිං වැහුවා. මගේ කොට්ඨාශයෙත් එක ළිඳක්වත් වහන්න මම යෝජනා කරේ නෑ. ඇත්තටම මාර්ගයට අවහිරතාවයක් තියෙනවානම් කොන්ක්‍රීට් එකක් යොදලා හරි පාර ගන්න. ළිඳ වැහුවොත් කවදා හරි හිතෙයි අපරාදයක් කියලා. මගේ අදහසක් විතරයි මේ කිවුවේ. ඒක විනාශ වෙලා තියෙනවානම් අලුත්වැඩියා කරලා පුලුවන් කෙනෙකුට ප්‍රයෝජනයට ගන්න හදන්න. ඒ ළිං වහපු එකේ විපාකය දැනටම ඇවිල්ලා තියෙනවා. ඔබතුමාගේ යෝජනාවට හරස් වීමක් නෙමෙයි මම කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒකට තාක්ෂණ නිලධාරි වාර්තාවක් අරගෙන ඉදිරි කටයුතු කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- 14. නරාවල කාසල්හිල් වත්ත ගම්මානයේ නො. 257 නිවසේ සිට කනත්ත දක්වා දිවෙන මාර්ගය රණවිරු සිසිර කුමාර රණවීර මාවත ලෙස නම් කිරීමට යෝජනා කරමි.

මේක අපේ රට වෙනුවෙන් දිවි පුදපු රණවිරුවෙක් වෙනුවෙන් තමයි කරන්නේ. මේ යෝජනාවත් සමග මම ලිපියකුත් ලබා දුන්නා. ඒ ලියුම ඇවිල්ලා නෑ සභාවට.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- මේ මාවත රණවිරු සිසිර කුමාර රණවීර මාවත නමින් නම් කරන්න බැරිනම් සිසිර කුමාර රණවිර මාවත නමින් නම් කරලා දෙන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මෙතන මෙහෙම ගැටලුවක් තියෙනවා. පළාත් පලාන දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරපු චක්‍රලේඛයක් තියෙනවා පළාත් පාලන ආයතනවල වීදි

රණවිරුවන්ගේ නම් වලින් නම් කිරීම සම්බන්ධව. මේ චක්‍රලේඛය අනුව මේ නම් කිරීම සිදු කරන්න හැකියාවක් නෑ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- රණවිරු කියන එකනේ ප්‍රශ්නය. රණවිරු කියන එක අයින් කරලා සිසිර කුමාර රණවීර මාවත නමින් නම් කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක මියගිය රණවරුවට කරන අපහාසයක්නේ මන්ත්‍රිතුමා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මුලු බලප්‍රදේශයම බලලා මාර්ගයට අවහිර වෙන්නේ නැති හොඳ තැනක් තෝරගෙන එතන ස්මාරකයක් හදලා මේ බලප්‍රදේශයේ ඉන්න සියලුම රණවිරුවන්ගේ නම් ඔක්කොම ගහන්න. ඒක හොදයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේ චක්‍රලේඛ නිකුත් කරලා තියෙන්නේ 2008 සැප්තැම්බර් මාසයේදී. නමුත් යුද්ධය ඉවර වුනේ 2009 මැයි 18 වෙනි දින. දැන් මම හිතනවා රණවිරුවන්ගේ මරණ දැන් එන එක ඉතාමත්ම අඩුයි. මගේ පුද්ගලික මතය නම් විරෝධතා කැඳවලා විරෝධතා නැත්නම් මේ නම් කිරීම සිදු කිරීමට ගැටලුවක් වෙන එකක් නෑ. අපි සභා තීන්දුව ගමු මේ නමින් නම් කරන්න. ඊට පස්සේ කොමසාරිස්තුමාගේ අවසරය ගමු.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** මේ සභා තීන්දුව අරගෙන චක්‍රලේඛ නිකුත් කරපු තැනටම යවමු අපි.

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- 15. කන්දේගොඩවත්ත අල්විස් මහතාගේ නිවස දෙසට ඇති අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- 16. මුලන 127 නිවස අසල මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- 17. කැස්ටල්හිල් ගම්මානයේ සියලුම මාර්ග ප්‍රිමික්ස් ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- 18. නරාවල කොට්ඨාශයේ අබලන් වූ වීදි පහන් ඉවත්කර නව වීදි පහන් සවිකිරීමටත්, වීදි පහන් නොමැති ස්ථාන සඳහා නව වීදි පහන් සවිකිරීමට වීදි පහන් කට්ටල 100 ක් ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය.)

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 19. අප බලප්‍රදේශයේ ජනතාවට දිවා කාලයේ ජලය ලබා දීම පිළිබඳව මේ වන තෙක් විසඳුමක් ලබා නොදීම හේතුවෙන් දිවා කාලයේ ජලය ලබා දීමටත්, බලප්‍රදේශයේ නව ඉල්ලුම්කරුවන්ට කඩිනමින් ජලය ලබාදෙන ලෙසත් යෝජනා කළද, තවමත් ක්‍රියාත්මක වී නොමැත. එබැවින් ඒ වෙනුවෙන් මහජන විරෝධයක් පෙළ ගැස්සවීමටත්, ඉන් විසඳුමක් නොමැතිනම් සභාව මැදිහත් වී ක්‍රියමාර්ග ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ජල සම්පාදන මණ්ඩලය කියනවා පදිංචි නිවාස වලට විතරයි කියලා ජලය ලබා දෙන්නේ. දැනට ඉල්ලුම්කරුවන් 3000 ක ගේ විතර ලැයිස්තුවක් තියෙන්නේ. දැනට 1500 ක් විතර දීලා තියෙනවා. හැබැයි මේ කොන්දේසි සියල්ලම කඩකරමින් කරාපිටිය ප්‍රදේශයේ තට්ටු 05 ක ගොඩනැගිල්ලක් හදනවා. ඒකට වතුර දීලා තියෙනවා. තිලක් අබේරත්න, සුවසෙවණ, ගොඩකන්ද, කරාපිටිය, ගාල්ල ලිපිනයේ තමයි ඒ ගොඩනැගිල්ල හදන්නේ. මේ ගොඩනැගිල්ලේ ඉදිකිරීම පටන් ගන්නකොටම ජලය ලබා දුන්නා සතියක් ඇතුළත. ඊට පස්සේ උළුවිටිකේ, ඉලේපෙරුම මාවතේ අඩිතාලම දාලා දවස් දෙකෙන් වතුර දුන්නා. අනිත් මිනිස්සු ලැයිස්තුවේ ඉන්න ඕනේ ගෙදර හදලා පදිංචි වෙන්නත් ඕනේ වතුර ගන්න. මම යෝජනා කරනවා දැනට තියෙන ලැයිස්තුවේ වතුර ලබා නොදීපු අයට වතුර ලබා දෙන්න සභාව මැදිහත් වෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** හැබැයි දිගටම ක්‍රියාමාර්ග ගන්න කිය කිය ඇතහැරලා දාන්න බෑ මේක.

( ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදු විය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරනවා අපි එකතු වෙලා විරෝධතාවයක් සංවිධානය කරලා පවත්වමු කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ලියනගේ මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතා හොඳ යෝජනාවක්. ඒක මීට පෙරත් ගෙනාවා. එක පාරට අපි මන්ත්‍රීවරු ගිහින් සත්‍යග්‍රහයක් කරලා වැඩක් නෑ. ඒගොල්ලෝ කියයි අපි ඒගොල්ලන්ව දැනුවත් කරේ නෑ කියලා. අපි මුලින්ම යමු කට්ටියම එකතු වෙලා. ගිහින් කැගහලා සද්දේ දාලා කියමු. ඉදිරි දිනයක් දා ගමු මේකට.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මට ලියනගේ මන්ත්‍රීතුමා ගෙනාපු වතුර සම්බන්ධ යෝජනාව ගැන අදහස් දක්වන්න ඕනේ. අපි මේ ප්‍රාදේශීය සභා මැතිවරණයට තරඟ කරන කොට තමයි වතුර ප්‍රශ්නය ගොඩක්ම බලපෑවේ. එක විසඳනවයි කියලා කිවුවා. ඒ වෙලාවේ අපි මේ වගේම උද්ඝෝෂණයක් කරන්න ලෑස්ති කරා. නමුත් ඒ වෙලාවේ අපිට පොලීසි වලින්, වෙනත් ආයතන වලින් උපදෙස් දුන්නා ඒ දේ කරන්න එපා කියලා මේ මැතිවරණ කාලය හින්දා. නමුත් ඉස්සරහදී බල ප්‍රදේශයට ජලය ලබා දෙන්න කටයුතු කරනවා කියලා කිවුවා. සභාවේත් අපි මේ ගැන දිගින් දිගටම කතා කරා. ජලය ලබා දෙනවයි කිවුවා මාස 06 ක් ඇතුළත. ඒත් දවස් 04 ක් 05 ක් එක දිගට

ජලය ආවා නමුත් ඊට පස්සේ නෑ. මම අහන්න කැමතියි ජල සම්පාදන මණ්ඩලයෙන් මෙහෙම ජලය ඇවිල්ලා ආපහු නවතින්න හේතුව කුමක්ද කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 20. ගල්කැටිය, බීරිගෙවත්ත මාර්ගයේ ආරම්භක ස්ථානයේ ආරක්ෂිත බැම්මක් ඉදිකිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මාර්ගයේ ආරම්භක ස්ථානයේ කණ්ඩියක් කැපීම නිසා බැවුම කැඩී ගෙන ගිහින් මාර්ගයත් ටික ටික කඩාගෙන යනවා. එම නිසා බැම්මක් බැඳිය යුතුයි එම ස්ථානයේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 21. ගොඩකන්ද ලබුදූව මාර්ගයේ චන්දන ජයලත් මහතාගේ නිවස ඉදිරිපිට නිවාස කිහිපයක් මාර්ගයේ ගලා යන වැසි ජලය හේතුවෙන් යටවී පීඩාවට පත්වෙයි. මෙම පීඩාකාරී තත්ත්වය මගහැරීම සඳහා කාණුවක් ඉදිකිරීමට යෝජනා කරන අතර, මාර්ගය දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් බැවින් දන්වා යැවීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** 22. අනවසර ඉදිකිරීම් සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කිරිමේදී ඇති වී තිබෙන බාධාවන් ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අර මම ඉස්සෙල්ලා කතා කරපු කරාපිටිය, ගොඩකන්ද, සුවසෙවණ ලිපිනයේ පදිංචි තිලක් අබේරත්න මහතාගේ නිවස සභාවෙන් අනුමත කරලද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ ගැන ලිඛිතව දැනුම් දෙන්න. ඊළඟ සභාවේදී හොයලා කියන්නම්.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** අපේ ගයාන් ගීතික මන්ත්‍රීතුමාගේ යෝජනාවට අදාළ වන ගැටලුවක් තියෙනවා. තොටගොඩ හේනවත්ත දුමින්ද මහතාගේ නිවසට එන මාර්ගයේ ගල් බැම්මක් දැම්මා. අපේ තාක්ෂණ නිලධාරි ඇවිත් ඒක නැවැත්තුවා. මේ වෙනකම් ඒකට අනුමැතිය ගත්තෙත් නෑ. කඩා ඉවත් කරෙත් නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** සභාපතිතුමනි, ඔය ගමන්ම මම මතක් කරන්න ඕනේ අපේ කොට්ඨාශයේ තියෙනවා ඒ වගේ අනවසර ඉදිකිරීම්. මම දිනුෂ මහත්තයාව දැනුවත් කරා ඒ පිළිබඳව. දැන් එම ස්ථානයේ බැම්මක් බැඳලා තාප්පෙත් බැඳලා ඉවරයි. ඔබතුමාගේ අණත් නොතකා ක්‍රියාත්මක වෙනවා. ඒකට ක්‍රියාමාර්ගයක් ගන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ-තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතාට අනවසර ඉදිකිරීම් පිළිබඳව සභාව දැනුවත් කරන්න මම කාරක සභාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>**කාරක සභා අවස්ථාව**</u>

- තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා විසින් අනවසර ඉදිකිරීම් පිළිබඳව මේ වන විට ගෙන ඇති තීන්දු තිරණ සම්බන්ධව සභාව දැනුවත් කරන ලදී.
- අනවසර ඉදිකිරීම් සඳහා අධිකරණ ක්‍රියාමාර්ග කඩිනමින් ගන්නා ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් තාක්ෂණ නිලධාරි දිනූෂ රත්නප්‍රිය මහතා වෙත උපදෙස් ලබා දෙන ලදී.
- අනවසර ඉදිකිරීම් පිළිබඳව ඇති ගැටලු අප ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු කා.කා.ස. ටෙල්සි ශ්‍යාමලි ගුණතිලක මෙය වෙත ඉදිරිපත් කොට සභාපතිතුමා හරහා තාක්ෂණ නිලධාරීන් දැනුවත් කොට අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙස ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සභාව දැනුවත් කරන ලදී.

මීට අමතරව මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන්ට අනවසර ඉදිකිරීම් පිළිබඳව ඇති ගැටලු සාකච්ඡා කරන ලදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කාරක සභා අවස්ථාව අවසන් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 23. වැලිපිටිමෝදර ග්‍රාමසේවා වසමේ ජීවත්වෙන ජනතාව වෙනුවෙන් පොදු කටයුතු කර ගැනීම සඳහා ස්ථානයක් නොමැති වීම නිසා මහත් අසීරු තත්ත්වයකට පත්ව ඇත. ඒ සඳහා ඉල්ලීම්ද කර ඇත. මෙම අපහසුතාවය මග හරවා ගැනීම සඳහා එම ග්‍රාම සේවා වසමේ ඇති වැලිපිටිමෝදර පොදු සුසාන භූමියෙන් කොටසක් හඳුනා ගෙන ඇත. එම බිම් ප්‍රමාණයෙන් පර්චස් 15 ක පමණ ප්‍රමාණයක් පොදු කටයුතු කර ගැනීම සඳහා ප්‍රජා ශාලාවක් ඉදිකිරීමට ලබා දීමට සුදුසු බවට යෝජනා කරමි.

එම ස්ථානය මම පරීක්ෂා කරා. අක්කර එකහමාරක පමණ භූමියක් ඒක. ඒකෙන් පර්චස් 15 ක් ලබා දුන්නම ඇති.

**ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** 24. වැලිපිටිමෝදර කොට්ඨාශය සඳහා කැඩී ගිය වීදි ලාම්පු වෙනුවට අලුතෙන් වීදි ලාම්පු කට්ටල 30 ක් මාගේ ප්‍රතිපාදන තුලින් ලබා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- 25. හෝළුවාගොඩ වෙල්යාය හරහා අධිබලැති විදුලිරැහැන් ඇද ඇති මාර්ගය කෘෂි වේල්ලක් ලෙස සකස් කිරීමට යෝජනා කරන අතර, එම යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

මේකේ අක්කර 400 ක් 500 ක් විතර තියෙනවා දෙපැත්තෙම. අද කෘෂි වේල්ලක් හදලා තියෙනවා. මම දන්නේ නෑ ඒක කොච්චර ප්‍රයෝජනවත්ද කියලා. නමුත් මම මේ යෝජනාව මීට කලිනුත් කරලා තියෙනවා. ඒක අවුරුදු ගාණක් වෙනවා කෙරුනේ නෑ. ඒ යෝජනාව නැවත ගෙන ඒමේ හැකියාවක් තියෙනවා. ඊයේ දවසේ මේ යෝජනාව සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කිරීමේ හැකියාව තිබුණා මන්ත්‍රීවරු හිටියනම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඊයේ සම්බන්ධීකරණ කමිටුවේදී කතාකරලා තිබුණා වැව් දෙකක් හදන්න හෝළුවාගොඩ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඒක හදන්න කියන්න. කුඹුරේ ගොයම් කපලා ගේන්න විදියක් නෑ. ට්‍රැක්ටරයක් යන විදියේ මාර්ගයක් හදන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- 26. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයට අයත් අවසතු කරන ලද ඉඩම සඳහා පවරා ඇති නඩුව සම්බන්ධව රෙජිස්ට්‍රාර්තුමා නිකුත් කරන ලද ලිපිය මේ සමඟ ඉදිරිපත් කරන අතර, එම ඉඩම වෙන්දේසි කිරීම සඳහා අවසර නොදෙන ලෙසත්, ඉඩම තුළ ඒ සම්බන්ධ බැනරයක් ප්‍රදර්ශනය කරන ලෙසත් යෝජනා කරමි.

මම ඉතා ගෞරවයෙන්, වගකීමෙන් මේ සභාවට කියනවා. අද දවසේ මේ ලියුම රෙජිස්ට්‍රාර්තුමා දෙන්න පොරොන්දු වුනා. නමුත් විදුලිය නැති නිසා ලියුම ලබා ගන්න විදියක් නෑ. හෙට දවසෙම මේ ලියුම සභාපතිතුමාට ලැබෙන්න සලස්වන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ ඉඩමේ බැනර් එකනම් දාලා තියෙන්නේ අබේසේකර මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මේ ප්‍රශ්නය සම්බන්ධව අපේ නායකයෝ කොහොම වෙතත් මන්ත්‍රීවරු හැමදෙනාම එක මතයක සිටීම ගැන මගේ ප්‍රසාදය හා සන්තෝෂය ප්‍රකාශ කරනවා.

27. කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාල භූමිය අවසතු කිරීම සම්බන්ධව සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද පැමිණිල්ල සම්බන්ධව කරන ලද පරීක්ෂණයේ විස්තරාත්මක වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මේක මම ගිය සභාවෙත් යෝජනා කරා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් කරා. ඒ පරීක්ෂණයේදී බොහොම පැහැදිලිව වැරැද්දක් කරා කියලා නඩු නිමිත්තක් තියෙන නිසා තමයි නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් මේ ගැන විමසලා ලිපියක් යවන්න කියලා යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපිට මේ ගැන, කවුද කරේ කියලා ඒ විස්තර ටික ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- පසුගිය සභා යෝජනාවක් අනුව ඒක යැව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කවුද පැමිණිලි කලේ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- සභාවෙන් ඉදිරිපත් කරේ පැමිණිල්ල. මෙහෙන් ලිපිගොනු ගෙන්වාගෙන පරීක්ෂණය හමාර කරා. කොච්චර හොර විදියට කුලරත්න කියන පුද්ගලයා වැඩ කරාද කියලා කියනවානම් පරීක්ෂණය ඉවර කරලා නීතිපති දෙපාර්තමේන්තුවට යැව්වා නඩු නිමිත්තක් තියෙන නිසා. ඒක ගැන තාම මුකුත් නෑ. මේ සභාවේ යෝජනාවක් තියෙනවා ඒ අනුව ලියුම් යැව්වේ. ඒ ලියුම්වල පිටපත් මම අද ගෙනාවේ නෑ. මම ඒ යවපු ලිපිවල පිටපත් ගෙනත් දෙන්නම්.

ඊළගට එකක් තියෙනවා සභාපතිතුමා. මේ ටික තේරුම් ගන්න ඕන නිසයි කියන්නේ. බොහොම පැහැදිලිව ප්‍රාදේශීය ලේකම් එකෙන් ඉල්ලනකොට නීතිපති දෙපාර්තමේන්තුවෙන් එවනවා ලියුමක්. ඒක නීතිපති නෙමෙයි එවුවේ. ගාල්ලේ උසාවියෙත් නීතිඥයෝ ඉන්නවා. ඒ අය ලියලා යවනවා ලියුමක් මේක බාධාවක් නෙමෙයි කියලා. මේ ඉඩම අවසතු කිරීම බාධාවක් නෙමෙයි කියලා නීතිපති එකේ ඉන්න නීතිඥයෙක් ලියුමක් එවලා තියෙනවා. මේක අරගෙන තමයි මේ කියන්නේ. ඒක අපේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ වරදක් නෙමෙයි. මේ පිළිබඳව අහලා යවලා අපිටත් පිටපතක් දෙන්න ඒකේ. එහෙන් අවශ්‍ය කටයුතු කරගන්න.

28. අනවසර ඉදිකිරීම් සම්බන්ධව ගෙන ඇති අධිකරණ ක්‍රියාමාර්ග සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් සභාගත කරන මෙන් යෝජනා කරමි.

මේක ගැන පැහැදිලි වාර්තාවක් දෙන්න. කොච්චර වැඩ තියේද කියලා තාක්ෂණ නිලධාරින්ට අපිට අදාළ නෑ. දිගින් දිගටම මේ ප්‍රශ්නය තියෙනවා. සභාවක් මෙච්චර වෙලා යන්න ඕන නෑ මේ ප්‍රශ්න නැත්නම්. මේ ප්‍රශ්න වලටනේ වැඩි වෙලාවක් යන්නේ.

මම බොහොම පැහැදිලිව කියලා තියෙනවා බටුවන්තුඩාව පන්සල ඉස්සරහ තියෙනවා තට්ටු තුනක මහල් නිවාසයක්. මේක ඒ පාරේ යන ඕන එක්කෙනෙකුට පේනවා. මේක වෙන්දේසි ඉඩමක්. මූලික නීතියක් තියෙනවා නේවාසික භූමියක නම් ගෙයක් හදන්න 60% පාවිච්චි කරන්න පුලුවන්. පර්චස් 10 නම් පර්චස් 06 යි. නමුත් මේකේ පාරට එනකම්ම ගේ හදලා තියෙනවා. කවුද මේවා අනුමත කරපු නිලධාරියා. මම මේක ගැන අද දවසේ කතා කරන්නේ 25 වෙනි වතාවට විතර. මම නැවත මතක් කරන්නේ නෑ ලීඩ්ස් ඉන්ටර්නැෂනල් ආයතනය පිළිබඳව.

ඊළගට අනවසර ඉදිකිරීම් සම්බන්ධව පෝද්දල පොලීසිය හැසිරෙන විදිය ගැන විශේෂයෙන් සඳහන් කරනවා. බය නැතුව කියනවා මේකේ ඉන්න ඕ.අයි.සී මහත්තයා කිසිම වෙලාවක පස් කැපිලි, ඇදිලි, ගොඩකිරිලි පිළිබඳව මේ කවුරු කතා කරත් ඒවා ගැන බලන්නේ නෑ. මම උදාහරණයකට කියන්නම්. මෙතන දහනායක හාඩ්වෙයාර් එක, එක දිගට ගොඩකරනවා. අද වෙනකං තියෙනවා කිසිම පියවරක් ගන්නේ නෑ. ඊරියගහ හන්දියේ නඩු නිමිත්තක් තියෙන තැනක් තියෙනවා. ජල පෝෂිත ප්‍රදේශයක්. සම්පූර්ණයෙන්ම ගොඩ කරලා දාලා තියෙනවා. දැන් මේක කරන්නේ මෙහෙමයි. එක පාරකට පස් කියුබ් 10 ක් 12 ගෙනත් දානවා. පොලීසියට ගිහින් පැමිණිල්ලක් දැම්මහම ඒ පස් ටික එහෙමම තියෙන්න ඇරලා ටික දවසකින් පස් ටික තුනී කරලා දානවා. ආයේමත් පස් ගෙනත් දානකොට පොලීසිය දැනුවත් කරහම කියනවා ආයිමත් පැමිණිල්ලක් දාන්න කියලා. අහිංසක මිනිහෙක් පස් කියුබ් 01 ක් ඇද්දොත් උසාවි අරං ගිහින් රුපියල් පනස් දාහක්, හැට දාහක් දඩ ගහනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- මේ ගොල්ලො දිගටම කරන්නේ මේ වැඩේ. තුට්ටු දෙකට ඉඩම් අරගන්නවා. හපුගල ඔබතුමන්ලාගේ ප්‍රදේශයෙන්. සම්බන්ධීකරණ කමිටුවට අපිට යන්න බැරිවුන එකේ ප්‍රශ්නය තියෙන්නේ මේකයි. අපි දන්නේ නෑ දේශපාලඥයෝ මේවා පිටිපස්සේ ඉන්නවාද කියලා. ඒක පැහැදිලි වෙනවා අපි මේ ප්‍රශ්නේ ගෙනිහින් සම්බන්ධීකරණ කමිටුවේ කතා කරනවානම්. මම ගෞරවයෙන් ඉල්ලනවා. ඒ බලතල තියෙන්නේ අපිට. ඒක හින්දා වහාම මේවාට

අධිකරණ ක්‍රියාමාර්ග ගන්න. මම නම් අපේ තාක්ෂණ නිළධාරි මහතාට කතා කරලා හැමවෙලේම කියනවා සටහනක් දා ගන්න මෙන්න මේ දවසේ පස් ගෙනාවා කියලා. මේ සම්පූර්ණයෙන්ම ජල පෝෂිත ප්‍රදේශයක් ගොඩ කරලා තියෙන්නේ. දවස් දෙක තුනකට කලින් පස් කියුබ් 15 ක් විතර ගෙනත් දාලා තිබුණා. දාලා ඉවර වෙලා ඊට පස්සේ දවසෙම තුනී කරා. මේ උපදෙස් දෙන අය ඉන්නේ පොලීසියේ. ඒක හින්දා මේ පොලීසියේ නිලධාරීන්ගේ තරම ගැන මම කියන්නම්. සමෘද්ධි බැංකුව එහා පැත්තේ ඉඩමක පස් කැපුවා. ඊරියගහ හන්දියේ කපපු පස් වලට සම්පූර්ණයෙන්ම වග කියන්න ඕන. ඒ වෙන්දේසිකාරයොන්ටවත් ඒ පස් ටික විකුණ ගන්න වුනේ නෑ. මේ ගොල්ලන් කියන තැන්වලට තමයි ගෙනිහින් දාන්න වුනේ. ඒ එකම දේකටවත් නීතිය ක්‍රියාත්මක කරන්නේ නෑ පෝද්දල පොලීසියේ මේ නිලධාරියා ඉන්නකම්. පොලිසියේ ඉන්න පහල නිලධාරීන් මේක බොහොම පැහැදිලිවම කියනවා. පහළ නිලධාරීන් මේ පිළිබඳව දන්නවා. ඕ.අයි.සී මහත්තයාට ඕන විදියට තමයි ඒ වැඩ කරේ. ඒ නිසා මේ පිළිබඳව ගරු සභාපතිතුමනි අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- කරාපිටියේ පන්සල අසල වෙළඳාම් කරන අය අපේ බලප්‍රදේශයට අයිති. පොලිසිය තමන්ගේ හිතුමතේට පෞද්ගලික උවමනාවන් වෙනුවෙන් ඒ අයව ඉවත් කරා පහුගිය 13 වෙනිදා. ඒ මිනිස්සුන්ට දැන් ජීවත් වෙන්න ක්‍රමයක් නෑ. ඒක හදන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** චනක මන්ත්‍රීතුමාගේ කථාවට මම ඌන පූර්ණයක් කරන්නම් ගරු සභාපතිතුමනි. ඔය කියන පිරිස නම් වශයෙන් අවශ්‍ය නෑ. ඒ අය එතන අවුරුදු ගානක් වෙළඳාම් කරා. කරාපිටිය පන්සලෙන් ඒ අයව ඉවත් කරන්න හදනකොට මම දායක සභාවෙත් කතාකරා. දායක සභාව කිව්වා පන්සලේ ගේට්ටුව අවහිර වෙන නිසා මේ අයව ඉවත් කරන්න ඕන කියලා. ඒ අය එතන රැකියාව කරන්නේ අවුරුදු ගානක ඉඳන් නිසා ඒ අයව එම ස්ථානයෙන් ඉවත් කරන්න එපා. මේ අයට වෙළඳාම් කරගෙන යන්න දෙන්න කියලා මම කිව්වා. ඊට පස්සේ දායක සභාවේ සභාපති විමලරත්න මාපලගම මහත්මයා ඒකට අවසර ලබා දුන්නා ඒ තුන් දෙනාටම. එතනදි ප්‍රශ්නයක් පැන නැගුණා ගමේ වෙන අය ඉල්ලුවොත් මොකද කරන්නේ කියලා. වෙන අය සම්බන්ධයෙන් අදාළත්වයක් නෑ මේ අය අවුරුදු ගාණක ඉඳන් වෙළඳාම කරගෙන ආපු අය නිසා ඒ අයගේ පවුල රැකෙන්නේ එතන වෙළඳාම් කිරීමෙන් පමණයි කියලා මම කිව්වා. මේ නිසා ඒ අයට වෙළඳාම සඳහා අවස්ථාව ලබා දෙන්න කියලා මම කිව්වා.

පසුගිය දවස්වල පොලිසියේ ඕ.අයි.සී මහත්මයා ඇවිත් ඒ අයව ඉවත් කරා. ලියනගේ මන්ත්‍රීතුමා ඒ ගැන වැඩි විස්තර ප්‍රකාශ කරයි. පොලිසියට ඕන විදියට බලතල පාවිච්චි කරලා මේ අසරණයෝ ඉවත් කරනවා. කුඩු, කසිප්පු ජාවාරම්කාරයෝ පිළිබඳ කිසිම ක්‍රියා මාර්ගයක් නෑ. පහුගිය සභාවේදීත් මම කතා කරා කුඩු ප්‍රශ්නය පිළිබඳව. කුඩු තියෙන තැන් පවා මම පෙන්වලා දුන්නා. මාධ්‍යටත් බැනලා තිබුනා මෙහෙම දේවල් වාර්තා කරන්නේ ඇයි බෝපෙ පෝද්දල බල ප්‍රදේශය තුළ මේවා නෑ කියලා. මට ඔප්පු කරලා පෙන්වන්න පුලුවන් බෝපෙ පෝද්දල මම කියපු ප්‍රදේශවල ගොඩකන්ද සංස්කෘතික මධ්‍යස්ථානය අවට, පිං ළිඳ ගාව, කුඩු තියෙනවා කියලා. ඒ කුඩු පාවිච්චි කරන සමහර අයගේ අම්මලා, තාත්තා ඇවිල්ලා මට කියනවා මන්ත්‍රීතුමා අපේ පුතා මේ අය ආශ්‍රය කරනවා. මේ අය තමයි කුඩු ගේන්නේ කියලා කියනවා. කහදූවවත්තෙන් ගෙන්වනවා කියලා කියනවා. පොලීසියට විස්තර ලබා දුන්නට ක්‍රියාත්මක වෙන්නේ නෑ. පහුගිය දවස්වල ලබුදූව ප්‍රදේශයේ තරුණයෙක් පොලීසියෙන් අත්අඩංගුවට ගත්තා. අක්මීමන පොලීසියේ ඕ.අයි.සී මොකක්ද කියන්නේ උඩුල මන්ත්‍රීතුමාට ඇවිත් කතා කරන්න අපි නිදහස් කරන්නම් කියලා. මේකද වෙන්න ඕන. මේක පොදු කටයුත්තක්. මගේ පුද්ගලික කටයුත්තක් නෙමෙයි. කුඩු නවත්තන්න ඕන. වසංගතයක් මේක. තියෙන ඔක්කොම හූරගෙන කනවා. තරුණ පරපුරත් විනාශ වෙනවා. මුලු රටම විනාශ වෙනවා. ජනාධිපතිතුමත් කිව්වා පොලීසියට වෙසක් පෝයට කලින් මේ ප්‍රශ්නය ඉවර කරන්න කියලා.

පෝද්දල පොලීසියේ ඕ.අයි.සි කියලා තිබුනා උදුල මන්ත්‍රීතුමත් එක්ක මම බලා ගන්නම් කියලා. මාත් එක්ක මොනවා බලා ගන්නද, මේ පොදු ප්‍රශ්න. මගේ ප්‍රශ්න නෙමෙයි. මේ නිලධාරීන් ඇත්තටම හිතන්න ඕන හැමෝගේම යහපත. පොලීසියේ ඕ.අයි.සී ලා මීට වඩා වගකීමෙන් කටයුතු කරන්න ඕන කියලා මම කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- දිගින් දිගටම ඔය ගැටුම පොලීසියත් එක්ක යන්න බෑ. මම ඉල්ලීමක් කරන්නම් ඕ.අයි.සී මහත්මයාගෙන් මන්ත්‍රීවරු එක්ක සාකච්ඡාවක් ලබාදෙන්න කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- 29. බටුවන්තුඩාව වතුර ටැංකිය පාරේ ඇති තරංගා ලැන්ඩ්ස් ආයතනය කරන ලද වෙන්දේසි ඉඩම සම්බන්ධව හා බටුවන්තුඩාව පන්සල ඉදිරිපිට ඇති ඇක්සස් සමාගම කරන ලද වෙන්දේසි ඉඩම සම්බන්ධව විධිමත් පරීක්ෂණ කරන ලෙස දකුණු පළාත් ආණ්ඩුකාරතුමාව දැනුවත් කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා** :- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- මේකේ තත්වය ඔබතුමන්ලාට පැහැදිලි කරන්න ඕන. සභාපතිතුමා නම් ඒ පිළිබඳව දන්නවා. ඔබතුමා මේ ප්‍රශ්න පිළිබඳව හැප්පුනා. ඒ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් බොහොම පැහැදිලි තීන්දු තීරණ දුන්නා. අපිට සභාවට පොදු කටයුතු සඳහා ලබාගත යුතු ඉඩම පිළිබඳ දැනුම් දුන්නා.

මීට අමතරව ඔබතුමා දන්නවා බටුවන්තුඩාව පන්සලේදී තිබුණ සාකච්ඡාවේදී ගරු මන්ත්‍රීවරු, ප්‍රදේශයේ ජනතාව හිටියා. එතනදි බොහොම පැහැදිලිව කිව්වා ඉස්සරහ කොටස ගන්නේ නෑ කියලා. අක්කර 4ක් ගන්නේ නෑ කිව්වා. ඒක ඔබතුමන්ලා අපි ඉන්න තැනදී තමයි කිව්වේ. එන්.බී.ආර්.ඕ එක දීලා තිබුනා වාර්තාවක් මේක නිවාස ඉදිකරන්න නුසුදුසුයි කියලා. නුසුදුසුයි කියලා දුන්න වාර්තාව දැන් කොහොමද සුදුසු වෙන්නේ. ඉතිං මේ පිළිබඳව ආණ්ඩුකාරතුමාව දැනුවත් කරන්න. එතුමා උනන්දුවෙන් වැඩ කරනවා කියලා අපිට පේන්න තියෙනවා මේ වගේ දේවල් වලට. මම යෝජනා කරනවා එතුමාටත් මේ ප්‍රශ්නය යොමු කරන්න.

ඊලගට රොස්වුඩ් එකේ වතුර ටැංකිය පාරේ ඉඩම. මම තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලලා ගත්තා වාර්තාව. ඒ ඉඩම පහළ තියෙනවා වගුරු බිමක්. ඒක ගොඩ කරලා තියෙනවා. ඒකට අවසර ගන්න අවශ්‍ය නැති නිසා ගත්තේ නෑ කියනවා. ඊලගට එතනට පරිසර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ නැත්නම් කොතනටද පරිසර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ කියලා හිතෙනවා. පරිසර වාර්තාවක් අරගෙන නෑ ඒකට. මේ පිළිබඳව පැහැදිලි පරීක්ෂණයක් කරන්න කියලා ඉල්ලනවා. මේ තත්වය උපයෝගී කරගෙන තවදුරටත් කරන්න යන වෙන්දේසි කටයුතු නතර කිරීමට උපදෙස් ගන්න කියලා ඉල්ලීම් කරනවා.

30. ඉඩමක් වෙන්දේසි කිරීමට යන අවස්ථාවක එම ඉඩම සඳහා කේවියට් තහනම් ඉදිරිපත් කොට තිබේ නම් ඒ සම්බන්ධව අදාළ පුද්ගලයා හෝ ඉඩම් මිලදී ගන්නා ජනතාව දැනුවත් වීම සඳහා ඉඩම තුළ බැනරයක් ප්‍රදර්ශනය කරන මෙන් යෝජනා කරමි.

කේවියට් එකක් දැම්මා කියලා ඉඩමක් විකුණන්න බැරිකමක් නෑ. කේවියට් එකක් දානවා කියන එකේ තේරුම තමයි බොහොම පැහැදිලිව එතන ප්‍රශ්නයක් තියෙනවා කියන එක. ඉතින් ප්‍රශ්න දන්නවා නම්, අඩු මුදල් වලට පුද්ගලයෙක් ඉඩමක් මිලදී ගන්නවා නම් කමක් නෑ. හැබැයි අපි වෙන්දේසි ඉඩමක මේක දානවා නම් හොඳයි. මොකද ඉඩම් කැබලි මිලදි ගන්නා අය ඒ තත්වය දන්නේ නෑ. වෙන්දේසිකාරයෝ මේක හංගනවා. මේකේ තියෙන්නේ ප්‍රශ්නයක් තියෙනවා. කැමති නම් ගන්න.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

මේක ගැන මම නීතිඥ උපදෙස් අරගන්න ඕන.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේ පිළිබඳව මාගේ දැනුවත්භාවය අඩුයි. මම ඒක නිසා මේ ගැන නීතිඥ උපදෙස් අරගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මම කියන්නේ බැනර් එකක් දාන්න මේකට කේවියට් එකක් දාලා තියෙනවා කියලා. කාටවත් ගන්න එපා කියන්නේ නැනේ. ඒකට බාධාවක් නෑ. හැමෝම එහෙම කේවියට් දාන්න යන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඔබතුමා උපදෙස් අරන් මේ වැඩේ කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මේක මේ සභාවේ ගන්න ඕන තීන්දුවක්. මේකට උපදෙස් ගන්න ඕන නෑ. කේවයිට් තහනමක් තියේ කියලා ප්‍රදර්ශනය කිරීම නිසා කාටවත් වැරැද්දක් වෙන්නේ නෑ. කැමති නම් ඕන කෙනෙකුට ඉඩම ගන්න පුලුවන්. මේකේ නීති උපදෙස් ගන්න තරම් දෙයක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- සංවර්ධන බලපත්‍රය අපි දෙනවා. ඒ ගොල්ලෝ ඒ කොන්දේසි ඔක්කොම සම්පූර්ණ කරන්න ඕන. සම්පූර්ණ කරාම ඒගොල්ලොන්ට අයිතියක් තියෙනවා දිගින් දිගටම අපි මේක ප්‍රමාද කරනවා නම් නීතිමය පැත්තට යන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- සංවර්ධන බලපත්‍රය දෙන්න. සියලු දේවල් දෙන්න. මම ඉල්ලන්නේ කේවියට් තහනමක් මේකට දාලා තියෙනවා කියලා ප්‍රදර්ශනය කරන්න විතරයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා, කේවියට් තහනමක් ඉල්ලන්නේ සභාවෙන්ද ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- දැන් උදාහරණයකට, කපුහෙම්පල නන්දිමිත්‍ර විද්‍යාලයේ ප්‍රශ්නයට මම දාලා තියෙනවා කේවියට් එකක්. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙකුත් දාලා තියෙනවා කේවියට් එකක්. එතකොට ඒක සඳහන් කරන්න. එහෙම වුනා කියලා කව්රුවත් ඉඩම නොගෙන ඉන්න ඕන නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ප්‍රශ්නයක් තියෙනවා නම් සංවර්ධන බලපත්‍රය දෙන්නේ නැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මේක සංවර්ධන බලපත්‍රයට බලපාන්නේ නෑ. අපි සංවර්ධන බලපත්‍රය දුන්නා කියන්නේ ඒක ජනතාවට සුදුසුයි. ආරවුලක් නෑ කියන එකනේ. කේවියට් එකක් දැම්මම මේ වගේ ප්‍රශ්නයක් තියෙනවා. තමුන්නාන්සේලා ඒක කැමති නම් ගන්න කියන අදහස තියෙන්නේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමා කේවියට් එකක් කියන්නේ මොකක්ද කියලා පැහැදිලි කරන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- කේවියට් එකක් දානවා කියන්නේ මායිම් දාලා විරෝධතාවයක් දානවා. අයිතිය ගැන හරි මොනවා ගැන හරි දානවා. දැන් මම දාපු අරමුණ නන්දිමිත්‍ර විද්‍යාලය සම්බන්ධ ප්‍රශ්නයේදී පොදු ස්ථානයක් මංකොල්ලා කෑම කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කාටද කේවියට් එකක් දාන්නේ. නීතිඥයෙක්නේ දැන් කේවියට් එකක් නිකුත් කරන්නේ. ඒ කේවියට් එක නිකුත් කරන්නේ කොතනටද ?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඒ අය කේවියට් තහනම රෙජිස්ටර් කරන්න ඕන ඉඩම් රෙජිස්ට්‍රාර් එකේ. ඒ අය දැනුවත් කරනවා. අවසතු කරේ කුලරත්න නම්, කුලරත්නට දන්වනවා මේකට කේවියට් එකක් දාලා තියේ කියලා. කුලරත්න ඒක විකුණනවා නම්, කේවියට් තහනම දාපු කෙනාට  දන්වනවා කුලරත්න මේ ඉඩම විකුණනවා කියලා. ඒක තමයි වෙන්නේ. ඒ ඉඩම ඕන කෙනෙක් ගත්තාවේ. අපි ඉල්ලන්නේ නෑ ඒක දෙන්න එපා කියලා. ඒක දැනුම් දෙනවා එහෙම. ඉඩම විකුණලා ඉඩම් රෙජිස්ට්‍රාර් එකේ රෙජිස්ටර් කරන්න ආවමත් දැනුම් දෙනවා මේ අයට විකුණුවා කියලා ඉඩම. මම මෙච්චර වෙලා කිව්වේ ඒක. මම කිව්වේ නෑ මේකට කේවියට් තහනම තියෙන නිසා ඉඩම වෙන්දේසි කරන්න දෙන්න එපා කියලා. ඒ ඉඩමට කේවියට් තහනමක් දාලා තියෙනවා කියලා මිනිස්සුන්ව දැනුවත් කිරීමේ යුතුකමක් අපිට තියෙනවා. මේක කන්දක්ද, පල්ලමකද, භූ විද්‍යාත්මකව සුදුසුද නැද්ද කියනවා වගේම කේවියට් තහනමක් තියේ කියලත් දැනුවත් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කේවියට් කියලා එකක් තිබුනට, කේවියට් තහනම කියලා එකක් නෑ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- කේවියට් එකක් මම මගේ පෞද්ගලික ඉඩමට දාලා තියෙනවා. ඇයි දාලා තියෙන්නේ. මේකේ ඉඩම් ආරවුලක් තියෙනවා. කව්රුහරි මිලදී ගත්තොත් ගන්නේ ලෙඩක්, තොප්පියක් කියන්න. එතකොට මම ඒකට නඩුවක් යනවා. එහෙම උනාම කව්රුවත් ගන්න යන්නේ නෑ. ගන්නවා නම් ගන්නේ හැප්පිලා එහෙම ගන්න පුලුවන් කෙනෙක්. අපි මිනිස්සුන්ට වෙන්දේසි කරද්දි ලබා දෙන්නේ නිරවුල් ඉඩමක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මට තියෙන ප්‍රශ්නය ඕක දාලා අපි විහිළුවකට ලක්වෙයි කියලා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මම මේ සභාවේ අවුරුදු 12ක් ඉඳලා තියෙනවා. අනෙක් සභා වලටත් ගිහිං තියෙනවා. ඒ උනාට මෙහෙම දෙයක් මම නම් දැකලා නෑ. කොන්දේසි සම්පූර්ණ කරලා නැති නිසා ඉඩම් මිලදී ගැනීමෙන් වළකින්න කියලා අපිට බැනර් දාන්න පුලුවන්. නමුත් ඉඩම් රෙජිස්ට්‍රාර් එකට දීපු ලියවිල්ලකට අපිට පුලුවන්ද බැනර් දාන්න?

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- සියලු දෙනා තේරුම් ගන්න. මට කියන්න ඕන මේක. මේ කතාවෙන් කියන්නේ නෑ මේක ගන්න එපා කියලා. ගන්න හැබැයි තොප්පියක් තියේ කියලා කියන්නේ මේක.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මිනිස්සු නීතිය ගැන දැනුවත් වෙන්න ඕන. නීතිය දන්නේ නෑ කියන එක නිදහසට කාරණාවක් නෙමෙයි. මිනිස්සු දැනගන්න ඕන අනුකූලතා සහතිකය දීලා ඒ වැඩ ටික ඉවර උනාට පස්සේ තමයි නීත්‍යානුකූල වෙන්නේ ඊට පස්සේ මිලදී ගත යුතුයි කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඕන නම් නීතීඥයෝ 10ක් 15ක් ගෙන්නලා කතා කරන්න මේ පිළිබඳව. හෝම් ලෑන්ඩ් ආයතනය මට කෝටි ගාණක අලාභයක් ඉල්ලලා එවලා තියෙනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයාටත් යවන්න ඇති. ඒ ඇයි, ඒකේ බලපෑමක් තියෙන නිසා. ඒක දැනගත්තම මිනිස්සු ගන්න යන්නේ නෑ. එතකොට අපි ලබා දෙන සී.ඔෆ්.සී සහතිකයෙන් කියන්නේ මේ ඉඩම නිරවුල් ඉඩමක්. දැන් අපි හිතමු උදාහරණයකට හෝම් ලෑන්ඩ්ලා

මේ ඉඩම වෙන්දේසි කරනවා. මේකට කේවියට් එකක් දාලා තියෙනවා. දාලා තියෙන නඩුවෙන් අපි දිනනවා. දිනුවට පස්සේ අර බිම් කට්ටි ගනිපු හැමෝම අමාරුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- කපුමේපල ඉඩමට කව්රුද කේවියට් දැම්මේ?

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ප්‍රේමලාල් අබේසේකර දැම්මා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එහෙම කේවියට් දාන්න පුලුවන්ද?

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- දැන් හෝම් ලෑන්ඩ් ආයතනයට පුලුවන් මට විරුද්ධව ක්‍රියා මාර්ග ගන්න. එයාලා නිවැරදි නම් මගෙන් වන්දි ඉල්ලලා එවන්නේ නැනේ. එයලා දන්නවා ප්‍රශ්නයක් කියලා. නැත්නම් ඒ ඉඩම වෙන්දේසි කරලා දාන්න පුලුවන්නේ. කේවියට් එක හින්දා මේක විකුණතන්න බැරිවෙයි කියලා ප්‍රශ්නයක් තියෙනවා. අපි දෙන තහවුරුව මොකක්ද සී.ඔෆ්.සී සහතිකයෙන්. මේක නිරවුල් ඉඩමක්, ජල දූර්ග, භූ කම්පන මුකුත් නැති ඉඩමක් කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මේක ගැන අපි තවත් හොයලා ක්‍රියාත්මක කරමු.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- අනුමත කරලා තියෙනවා කිව්වා කරාපිටිය, ගොඩකන්ද, සුවසෙවණ ලිපිනයෙහි පදිංචි තිලක් අබේරත්න මහතා හදාගෙන යන අනවසර ගොඩනැගිල්ල. හැබැයි අවසර දුන්නා නම් ඒ අය ගොඩනැගිල්ල හැදුවේ අවසරය දීපු සැලැස්මට නෙමෙයි. මොකද මේ ගොඩනැගිල්ල මුළු ඉඩමෙම අන්ධ බිත්ති ගිහින් තියෙන්නේ. පටන් ගන්න තැන බොහොම පැහැදිලිව අඩි දෙකක් තියන්න ඕන කාණුව වතුර බැහැලා යන්න. දැන් අන්තිම හරියේ තියෙන්නේ අඩියක විතර ඉඩක්. හැම මන්ත්‍රීවරයෙක්ම ගිහින් මේක බලන්න. දැන් තුන්වෙනි තට්ටුවේ වැඩ යන්නේ. මේ ඔක්කොම තියෙද්දි බලන්න ජල සම්පාදන මණ්ඩලය හැසිරෙන විදිය. මොකක් නිසා ජලය ලබා දුන්නද?. අපි ගිහින් ඉල්ලුවොත් එහෙම අහිංසක මනුස්සයෙක් ගෙයක් හදනවා වතුර දෙන්න කියලා. ඒවාට දෙන්නේ නෑ. මේ හදාගෙන එන ව්‍යාපාරික ස්ථානයකට වතුර දීලා තියෙන්නේ. ජීවත් වෙන්න තැනක් හදා ගන්න ස්ථානයක් නෙමෙයි මේ. ඒක හින්දා මේ ඔබතුමාගේ බලතල. මේවා පාවිච්චි කරන්න. අපි ඉන්නවා ඔබතුමාත් එක්ක.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රි ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- 31. සභාවේ තාක්ෂණ නිලධාරීන්ගේ රාජකාරි බලප්‍රදේශ සම්බන්ධව විස්තරාත්මක වාර්තාවක් සභාගත කරන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී එන්. එම්. අනිල් බන්දුතිලක මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී එන්. එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** 32. කපුහෙම්පල පල්ලියගෙදර වත්තට යන මාර්ගයේ මීටර් 25 ක් පමණ පාරේ කොන්ක්‍රීට් අතුරා එම මාර්ගය සකස් කර දෙන ලෙසට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්. එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** 33. කපුහෙම්පල කාකුහේන වත්තට ඇතුල්වෙන මාර්ගයේ පී. පී. ප්‍රේමවති මහත්මියගේ නිවසට යන පාරේ මීටර් 15 ක් පමණ කැට ගල් අල්ලා සකස් කර දෙන ලෙසට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී එන්. එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** මේක බාගේට කරලා ගිහිපු වැඩ සටහනක්. රණවිරු මාතාවකගේ නිවසට යන මාර්ගයක් මේ. මේ පාර හදන්න මුදල් ආවේ රණවිරු සේවා අධිකාරියෙන් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලෙදී. මේ මීටර් 15 ඉතුරු කරලා තමයි වැඩේ කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ගෙවල් කීයකට යන පාරක්ද මේක.

**ගරු මන්ත්‍රී එන්. එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ගෙවල් හතරකට යන පාරක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- බලමු මොකක්ද කරන්න පුලුවන් කියලා.

**ගරු මන්ත්‍රී එන්. එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** 34. ලබුදූව වෙළඳ සංකීර්ණයේ දෛනිකව කරන කුණු ඉවත්කිරීම් සිදු නොවන බැවින්, දෛනිකව කුණු ඉවත්කර වෙළඳ සංකීරණයේ ඇති අඩුපාඩු සකස් කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒකට ස්ථිර සේවකයෙක් දැන් යොදවලා තියෙනවා. එයා දෛනිකව එතන සේවය කරනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එන්. එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** ලබුදූව වෙළඳ සංකීර්ණයේ කඩ කාමරයකට ප්‍රහාරයක් එල්ල වෙලා ඒ වීදුරුව අලුත්වැඩියා කරගෙන තියෙනවා ඒ කඩහිමියා. ඒකට තාම සභාවෙන් ගෙවීමක් කරලා නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒකට වැය වුන මුදල අපි ඉදිරි මුදල් කමිටුවකදී අනුමත කරලා ගෙවන්න බලාපොරොත්තු වෙනවා.

( ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා සභා ගර්බයෙන් පිටවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රීනි ඩී. පී. වාසනා උදයාංගනි මැතිණියගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- වාසනා මන්ත්‍රීතුමිය පුහුණුවකට සහභාගි වීම සඳහා සභා ගර්භයෙන් පිටත්ව ගිය නිසා එතුමියගේ යෝජනා මම ඉදිරිපත් කරන්නම්.

35. එස්.ඒ.එම්.අස්වර් මහතාගේ නිවස අසල මාර්ගයේ ජලයෙන් යටවන ස්ථානය උස්සා බෝක්කුවක් සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 36. සන්සයිඩ් ගාර්ඩන් දෙවන පටුමගේ පිවිසුම් මාර්ගයෙහි කාණු පද්ධතිය සාදා බෝක්කුවක් සකස් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

( ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය. )

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** දැන් ප්‍රීමික්ස් දානවානේ පාරවල් වලට. අපේ බලප්‍රදේශය තුල ගම්පෙරලිය යෝජනා විශාල ප්‍රමාණයක් තියෙනවා. නමුත් මගේ කොට්ඨාශයේ පාරවල් තුනක්, හතරක් තියෙනවා ගම්පෙරලියට යෝජනා කරපු නැති. ඒවගේ තියෙන්නේ වතුර ගන්න පාරවල් කඩපුවා. ඒ ටිකට ප්‍රීමික්ස් දාලා දෙන්න. නැත්නම් ඒ ටික තව තවත් කැඩි කැඩි යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පාරවල්වල නම් ලබා දෙන්න.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අනිත් එක සභාපතිතුමා දැන් වීදි ලාම්පු අපේ බලප්‍රදේශය තුල විශාල ප්‍රමාණයක් තියෙනවා. නමුත් මේ සභාවේ මම කීප පාරක්ම යෝජනා කලා කැඩිච්ච වීදි ලාම්පු ටික සකස් කරලා දෙන්න කියලා. ඒක කෙරුනේ නෑ. මගේ කොට්ඨාශය තුල වීදි ලාම්පු අලුතින් සවිකිරීමේ අවශ්‍යතාවයක් නෑ. නමුත් අර කැඩිච්ච ටියුබ් ලයිට් ටික අයින් කරලා දෙන්න. වීදි ලාම්පු අලුත්වැඩියා කරන අයට පැය 1/2 ක් පමණ යනවා ටියුබ් ලයිට් එකක් අලුත්වැඩියා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ අයින් කරන්න ඕන වීදි ලාම්පුවල ලැයිස්තුවක් හදලා දෙන්න කියලා මම විදුලි කාර්මිකයන්ට දැනුවත් කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ වෙනුවට එල්. ඊ. ඩී. බල්බ් සවිකරලා දෙන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා අර කුණු දාන එක සම්බන්ධව පසුගිය දවස්වල ගැටලු තිබුණා. කුණු එකතු කරේ නෑ සභාවෙන්. ගිංතොට ප්‍රදේශයේ ගෙවල් ලඟ ලඟ තියෙන නිසා කුණු ප්‍රශ්නය විශාල වශයෙන් තියෙනවා. ඒ කුණු ගනිපු නැති දවස්වල මම ලේකම්තුමාට කතා කරලා කිවුවා කොට්ඨාශයේ ඉන්න මන්ත්‍රීවරු කැඳවන්න කියලා. කැඳවලා තාවකාලිකව කුණු දාන්න පුලුවන් තැන් පිළිබඳව මන්ත්‍රීවරුගෙන් යෝජනා ගන්න කියලා. දැන් සභාපතිතුමා කුණු දාන ස්ථානය පිළිබඳව ප්‍රශ්න මතුවුනොත් කොට්ඨාශවල ඉන්න මන්ත්‍රීවරු කැඳවලා තාවකාලිකව කුණු දාන්න පුලුවන් තැන් පිළිබඳව බලන්න. මට පුලුවන් දැන් මගේ කොට්ඨාශයේ තැනක් හොයලා දෙන්න. පස් දාලා වහලා ඒ ප්‍රශ්නය නිරාකරණය කරන්න පුලුවන්.

වෙනදා ගිංතොට ප්‍රදේශයේ පාරවල් කීපයක කුණු ගන්න ගියා. දැන් ඒකට යන්නේ නෑ. ප්‍රධාන පාරේ විතරලු යන්නේ ට්‍රැක්ටරේ. විදානගොඩ පාර, පරමියාගොඩ පාරේ කුණු ට්‍රැක්ටරේ යන්නේ නැලු. ඒ නිසා මම යෝජනා කරනවා මේකට හොඳම විසඳුම තමයි වාහනේ යන්නේ නැතුව කොළඹ මහ නගර සභාව, ගාල්ල මහ නගර සභාව වගේ අත්කරත්ත මගින් ඇතුල්පාරවල් වල තියෙන කුණු එකතුකරගෙන ඇවිල්ලා ප්‍රධාන පාරේ ට්‍රැක්ටරේ යනකොට ඒවා එකතු කරගෙන යන්න පුලුවන් නම් ලේසියි. ඒක කොළඹ, ගාල්ල, මහනගර සභාවල සිදු කරනවා. සභාවේ ඉන්න කම්කරුවෝ අත් කරත්ත වලට අතුරු පාරවල් වල තියෙන කුණු එකතු කරලා ගෙනියනවා. එතකොට වාහනවලට අතුරු පාරවල් වලට යන්න ඕන නෑ. ඒ වගේ දේවල් මම කලින් සභාවේදී යෝජනා කලා. නමුත් ඒවා කරේ නෑ.

බලප්‍රදේශයේ විශාල වීදි ලාම්පු ප්‍රමාණයක් තියෙනවා. මන්ත්‍රීවරු විසිදෙදෙනෙක් ඉන්නවා. එක මන්ත්‍රීවරයෙකුට අලුත්වැඩියා කටයුතු සඳහා එක දවස ගානේ විදුලි වාහනය දුන්නත් මාසෙකට එක පාරයි දෙන්න පුලුවන්. එක කොට්ඨාශයකට විදුලි වාහනය හම්බවුනාට පස්සේ තව මාසයක් බලාගෙන ඉන්න ඕන විදුලි වාහනය ගන්න. මගේ කොට්ඨාශයේ වීදි ලාම්පුවක් පිච්චුනොත් මාසයක්

බලාගෙන ඉන්න ඕන ඒක අලුත්වැඩියා කරන්න. ඒක නිසා මම පහුගිය දවස්වල යෝජනා කරා වීදි පහන් අලුත්වැඩියා සඳහා වාහන දෙකක් යොදවන්න කියලා. ඒක කරන්නත් බෑ කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒක මෙහෙමයි මන්ත්‍රීතුමා. බඩු නැතුව තදබදයක් ආවම තමයි එහෙම වෙන්නේ. නැත්නම් එහෙම ගැටලුවක් නෑ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** මගේ කොට්ඨාශයේ මාස දෙකක් විතර වීදි පහන් අලුත්වැඩියාවට ආවේ නෑ. උත්තර කියන්න බෑ මට මිනිස්සුන්ට. තුසිත මන්ත්‍රීතුමා දන්නවා තත්ත්වය.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** අපි විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් වුනාට සභාවට බනිනකොට අපිට කේන්ති යනවා. ඒක නිසා අපිටත් උත්තර බදින්න වෙනවා. මේ නිසා වීදි පහන් නඩත්තු ප්‍රශ්නයට හැකි ඉක්මනින් තීන්දුවක් ගන්න. කුණු ප්‍රශ්නයයි, වීදි පහන් ප්‍රශ්නයයි තමයි ගිංතොට කොට්ඨාශයේ විශේෂයෙන්ම තියෙන්නේ.

අනිත් එක තමයි බෝපෙ පෝද්දල බල ප්‍රදේශයේ සියලුම ඇල මාර්ග සුද්ධ කරන්න ඇමතිතුමාත් එක්ක සාකච්ඡා කරලා තියෙනවා. ළගදීම දිනයක් ලබා දේවී. සියලුම ඇලවල් අඩි 06 ක් වෙනකන් කපලා සුද්ධ කරනවා. සභාපතිතුමයි මන්ත්‍රීවරුයි එක්ක කතා කරලා දිනයක් දා ගමු කියලා කිවුවා. ඒ ඇල මාර්ග ඔක්කොම කපලා සුද්ද කරමු. හැබැයි එතකොට සමහර අය තර්ජනය කරාවි. බනීවි. සභාවට අයිති ඇළවල් ඔක්කොම කපලා සුද්ද කරහම වැස්සට පස්සේ වතුරට යටවෙන ප්‍රශ්න ඔක්කොම විසඳගන්න පුලුවන්.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** :- නරාවල විද්‍යාලයේ කපපු පස් තියෙනවා ගොඩගහලා. ඒවා ලබා ගන්න පුලුවන් කුණු බැහැර කරන ඉඩමට අවශ්‍යය නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- අපිට නොමිලේ පස් ලැබෙනවා. ඒක වෙනත් ක්‍රමයකින් හම්බුවෙනවා නම් නොමිලේ, ඔබතුමා මැදිහත්වෙලා අපි ඒ පස් ලබා ගන්නවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** :- සල්ලි අවශ්‍යය නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ක්‍රමවේදයක් ඔබතුමා සකස් කරලා කියන්න. අපි පස් ටික අරගෙන යන්නම්.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** :- සභාවේ කොරිපස් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරානේ. ඒකට මොකද වුනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒක කොරිපස් නෙමෙයිනේ පස්නේ. ඒකයි හරිගියේ නැත්තේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** කොරිපස් කියුබ් එක රුපියල් පන්සියයට තියෙනවයි කිවුවා පෝද්දල.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** :- එහෙම වුනොත් කොරිපස් සඳහා නැවත මිල ගණන් කැඳවන්න වෙනවද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඔව් අවශ්‍ය වෙනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පාර වතුරට යටවෙනවානම් කොරිපස් දාන එක වැඩක් නෑ කියලා තමයි තාක්ෂණ නිලධාරීන් කියන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා** ඃ- දිනුෂ මහත්තයා කිවුවා කොරිපස් දාලා පාර ඉස්සුවට පස්සේ හරි කියලා. එතුමා ගිහින් බැලුවා. ඒ ජම්බුගස් වත්තේ පාර. ඔබතුමාට කතා කරහම කරලා දෙන්නම් කියලා තිබුණා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- තාක්ෂණ නිලධාරීන්ගේ උපදෙස් අරගෙන ක්‍රියාත්මක කරන්න ඒක.

**(ඊ) කාරක සභාවල වාර්තා**

**1. මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටුව.**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019.03.06 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- අපි වෙන විරෝධයකට නෙමෙයි මේ කමිටුවල අපි නැනේ. අපේ මේකට විරෝධයකුත් නෑ. අපි ප්‍රතිපත්තිමය හේතුවක් නිසා කමිටුවලට සම්බන්ධ වෙන්නේ නෑ. අපි බේදීමක් නොඉල්ලුවට මෙම කමිටු වාර්තා සම්මත කරන්න අපේ පක්ෂයේ අයගේ සම්බන්ධයක් නෑ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව සභා සම්මත විය.

**2. කර්මාන්ත හා සේවා කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019.03.06 වන දින පැවති කර්මාන්ත හා සේවා කමිටු වාර්තාව.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව සභා සම්මත විය.

**3. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව ඃ-** නැත

**4. පරිසර කමිටුව ඃ-** නැත

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛණ ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ පෙබරවාරි මස මාසික ලැබීම් විශ්ලේෂණය. (ප්‍රා.ස. 06)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

<u>02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ පෙබරවාරි මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස. 14)

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

<u>03. එකතුකළ ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ ජනවාරි මස සහ පෙබරවාරි මස සංසන්දනාත්මක මාසික ලැබීම් විශ්ලේෂණය

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ආදායම් වාර්තා පිළිබඳ ලේකම්තුමාට සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභාවක් මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාවල ඇති වැදගත්කම ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා විසින් සභාව දැනුවත් කරන ලදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ගරු සභාපතිතුමනි, මේ සභාවේ ආදායම් තත්ත්වය වැඩි කරන්න මම යෝජනා කීපයක් කරා. බැනර් වලින් අපිට කොයිතරම් ආදායමක් එනවාද?. මම බොහොම පැහැදිලිව යෝජනා කරා සතියකට දාන බැනර් සංඛ්‍යාව දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන්න කියලා. අද වෙනකොට ගිහින් බලන්න සභාපතිතුමා කොච්චර බැනර් දාලා තියෙනවාද කියලා. මේවායින් කීයකට සභාවට ගෙවීම් කරලා තියෙනවාද?. ඒවා යන්නේ කොහොමද කියලා හිතාගන්න බෑ. මේ දේවල් කරන්නේ නෑ. ඒවා පොඩි පොඩි දේවල්.

දැන් කියන්න බලන්න ටෙලිෆෝන් ටවර් වලින් එන ආදායම කොහොමද කියලා. ලොකු ආදායමක් ගන්න පුලුවන් ඒවාගෙන්. දැනට වාර්ෂිකව රුපියල් තුන්දාහයි ගන්නේ. ඇයි අපි ඒවා වැඩිකර ගන්න ක්‍රියාමාර්ග ගන්නේ නැත්තේ. අපි ගෙයක් බදු දුන්නට පස්සේ ඒ ගේ බදුගනිපු කෙනාට ඒක ආයේ බදු දෙන්න බෑ. අපි දීලා තියෙන්නේ එයාට විතරයි. බලන්න ටෙලිෆෝන් ටවර් එකක කී ජාතියක් එල්ලලා තියෙද කියලා. 10 ක් 15 ක් විතර තියෙනවා. මේවායින් ආදායම් ගන්න බලන්නේ නෑ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** බැනර් වලින් කරන අය කිරීම හරියට කරන්න. සමහරු බැනර් දානවා හිතුමනාපෙට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ගිය සතියේ බැනර් ලොරි දෙකක් කපාගෙන ආවා.

(සභාව පැහැදිලි නොවීය.)

<u>04. වෙනත් ලේඛණ</u>

<u>I. ප්‍රගතිය</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 2019 වර්ෂයේ මාර්තු මස මහා සභා රැස්වීමට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- දැන් ඔබතුමාගේ බලතල එක් එක් අවස්ථාවල පැවරීමේ හැකියාව තියෙනවා. ඒ වගේම පවරලත් තියෙනවා. අනතුරුදායක ගස් පිළිබඳව අපේ ලේකම්තුමාට තමයි බලය පවරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඔබතුමාලට දැන් ලබා දෙනවා අනවසර ඉදිකිරීම් පිළිබඳව ගනිපු අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර සහ තාක්ෂණ නිලධාරින්ට අයත් ග්‍රාම සේවා වසම් පිළිබඳ ඇතුළත් වාර්තා දෙකක්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- පොල් ගසක් කැපීම පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා වක්වැල්ලේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒ ප්‍රශ්නය දැන් පෙත්සම් කාරක සභාවට දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මේවා මෙච්චර දුර දිග යන්න දෙන්න එපා. බැලූ බැල්මට පේනවා නම් එම ගසෙන් අනතුරක් වෙනවා කියලා ඒක කපලා දාන්න. මේ සියලු මන්ත්‍රීවරු අත් දෙකම උස්සලා ඔබතුමාට සහයෝගය ලබා දේවි. දැන් මේකේ දැල් දාලා යන්න බෑනේ. ආරක්ෂාවක් නෑ. පණ්ඩිත මන්ත්‍රීතුමා මැදිහත් වෙන්න මේකට. අවුරුදු කීයක් තිස්සේ යනවාද?. තේරුමක් ඇති වැඩකුත් නෙමෙයිනේ මේක. ඒ හින්දා ඔබතුමා මේකට මැදිහත් වෙන්න. පෙත්සම් කාරක සභාවට යන එක තේරුමක් නෑ. මේ ගහ කපන්න කියලා තීරණය දීලා තියෙනවා. ලැජ්ජයිනේ ඕවයේ යන්න ගියහම.

ඊළගට සභාපතිතුමනි, ප්‍රගතියේදී අනවසර ඉදිකිරීම් පිළිබඳ ගනිපු අධිකරණ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් අපිට ලබා දුන්නා. ඒවාට ඉක්මන් ක්‍රියාමාර්ග ගන්න. දැනෙන්නත් එක්ක අහිංසකයන්ගේ දේවල් වලට නැතුව ප්‍රධාන ලොකු කීප දෙනෙක්ට ක්‍රියාමාර්ග ගන්න. ලීඩ්ස් ඉන්ටර්නැෂනල්, දහනායක හාඩ්වෙයාර්, දසනායක සර්විස් සෙන්ටර් මේ වගේ කීපයකට නඩු දාන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ඊරියගහ හන්දියේ ආරවුල බලන්න. මම හත් අට වාරයක්ම ලිඛිත පැමිණිලි කරලා තියෙනවා පොලීසියට. සභාව පැත්තෙන් මම ලේකම්තුමාට කියලා තියෙනවා. ඔබතුමා ඒකට පැහැදිලි තීන්දුවක් ගන්න. මම දින වකවානු, පින්තූර සමග සියලු විස්තර තියාගෙන ඉන්නේ.

කපුහෙම්පල උපුල් ගොඩගේ මහතාට සාධාරණයක් වුනේ නෑ කියලා කනස්සල්ලෙන් ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක දැන් වෙනමම පැත්තකට ගිහිපු ප්‍රශ්නයක් බවට පත්වෙලා තියෙන්නේ. උපුල් ගොඩගේ පාර්ශවය නෙමෙයි අනෙක් පාර්ශවය ඒ සම්බන්ධව ලියුම ගියාට පස්සේ ඇවිත් මාව හම්බ වෙලා කතා කරා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- දෙපාර්ශවයම ගෙන්වලා කතා කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- උපුල් ගොඩගේ පාර්ශවය එන්නේ නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මම එතුමව දැනුවත් කරන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- මම දෙන්නටම දැනුම් දෙන්නම්. නැවත සාකච්ඡාවට පැමිණෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- පෝද්දල පොලීසිය පිළිබඳව කතා කරා. තව පාරක් කතා කිරීම අනවශ්‍යයි කියලා හිතෙනවා.

ගම්පෙරලිය වැඩ පිළිවෙල පිළිබඳව පරස්පරතාවයක් නැතුව වැඩ කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

වෙන්දේසි ඉඩම් පිළිබඳ කතා කරපු නිසා මම ආයේමත් කතා කරන්නේ නෑ ඒ පිළිබඳව. කේවියට් තහනම පිළිබඳව ඔබතුමා ගන්න තියෙන උපදෙස් අරගන්න. අරගෙන ඒක ක්‍රියාත්මක කරන්න.

ඊළගට බැකෝ යන්ත්‍රය පිළිබඳව දැනගන්න කැමතියි. මොකද ඒකට වෙලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- සෙනොක් ආයතනය කියන්නේ ජේ. සී. බී. යන්ත්‍ර සඳහා ලංකාවේ අළෙවි නියෝජිත ආයතනය. එම ආයතනයෙන් තමයි ජේ. සී. බී. යන්ත්‍රයේ අලුත්වැඩියාව සිදු කලේ. ඒක අලුත්වැඩියා කරලා ගේනකොට පිස්ටන් එකකින් ශබ්දයක් ඇවිත් වැලිගමදි ඒක නැවත අරගෙන ගියා. ආයේමත් අලුත්වැඩියා කරලා බැකෝ යන්ත්‍රය ගෙනාවා. වාහනයක පටවගෙන තමයි ගෙනාවේ. එන්ජිම අලුත්හින්දා ඒ අය කිවුවේ දුර ප්‍රමාණය වැඩි හින්දා රත්වෙලා ප්‍රශ්න ඇති වෙයි කියලා. ජේ. සී. බී. යන්ත්‍රය මෙහෙට ගෙනල්ලා ටෙස්ට්න් එකකුත් කරා. අලුත් රියදුරෝ බඳවාගන්න මෝටර් රථවාහන පරීක්ෂකතුමා සහභාගි වෙච්ච සම්මුඛ පරීක්ෂණයේදී ඒක වැඩ කලා. ඊට පස්සේ වැඩ කරා දවස් දෙකක් විතර. කුණු බැහැර කරන්න වළ කපන්න යවන්න හැදුවහම අර සද්දේ නැවත එනවා. සෙනොක් එකෙන් ඇවිත් නැවත එන්ජිම ගලවගෙන අරගෙන ගියා. ඒකට අපි ගෙවීමක් කරන්න අවශ්‍ය නෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- මම කියන්නේ කාලය හා වියදම් කරපු මුදලත් එක්ක බැලුවහම මොන අපරාධයක්ද මේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒක පළාත් පාලන ඉංජිනේරුතුමා ගිහින් පරීක්ෂා කරලා බලලා ගෙනාවේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- හදපු තැන ඉඳන් සභාවට වාහනයෙන් එන්න බැරිනම් වැඩක් නෑනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඉංජිනේරුතුමා කියනවානම් එහෙම ගේන්න කියලා අපිට ඊට පිටින් යන්න බෑනේ. ඒගොල්ලෝ කිවුවේ ඒ කරපු අලුත්වැඩියාව සාර්ථක නෑ. වෙනත් දෙයක් කරන්න තියෙන්නේ ඒක කරලා සතියක් ඇතුළත දෙනවා කියලා තමයි පොරොන්දු වුනේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** අපි මුදල් කමිටුවේදිත් දවසක් ඕක ගැන කතා කලා. ඕක හදන්න කලින් ලක්ෂ ගාණක් යනවා කියපු නිසා හදන්න. යම් කිසි අලාභ හානියක් වුනොත් මොකක්ද අපි ගන්න පියවර. මේකට නඩුවක් තියෙන නිසා විකුණන්නත් බෑ. ඒ හින්දා මේක අලුත්වැඩියා කරන්න තමයි වෙන්නේ කියලා කිවුවා. වාහනය හදලා ඉවර වෙන කොටම ගැටලුවක් ආවානේ. ඒ අය වගකීම් කාලයක් දීලා තියෙන නිසා ගැටලුවක් නෑ. ඉදිරි කාලයේදීත් ඒ වගේ ප්‍රශ්න දිගින් දිගටම ආවොත් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- කරලා දෙනවානම් ප්‍රශ්නයක් නැහැයි කියලා නෑ. පාරේ ගෙනියන්න පුලුවන් වුනානම් පටවලා ගේන්න ඕන නෑනේ. වැඩිය හොඳයි පාරේ ගේන එක. එහෙම ප්‍රශ්නයක් තියෙනවානම් ඒ අය ගේන්න කියපු එක වැරදියි.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඉංජිනේරුතුමා කිව්වේ වැඩිපුර රේස් කරොත් ප්‍රශ්නයක් වෙයි කියලා. අපිට ඒක අභියෝගයට ලක් කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- කවුද එහෙම කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- පළාත් පාලන යාන්ත්‍රික ඉංජිනේරුතුමා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මොන රියදුරුද ගියේ වාහනේ අරන් එන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- මංජුල

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- මංජුල ජේ.සී.බී. යන්ත්‍රය පුරුදු වෙන්න පදින කෙනෙක්ද?. සරත් ජේ.සී.බී. එක පුරුදු වෙන්න පදින කෙනෙක්ද?. මංජුල මේකේ වැඩ කරේ අද ඊයේද?. සරත් මේකේ වැඩ කරේ අද ඊයේද?.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපිට නිර්දේශයක් ගන්න පුලුවන් ළගම කෙනා තමයි පළාත් පාලන ඉංජිනේරුතුමා. අපිට ඒක අභියෝගයට ලක් කරන්න බෑ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- අභියෝගයට ලක් කරන්න පුලුවන්. අභියෝග කරන්න පුලුවන් වෙන්න ඕන. ඒගොල්ලයි අපි ඉන්න තැන අභියෝග කරන්න ඕන සෙනොක් ආයතනයට මෙහෙම වෙන්නේ ඇයි කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- අපිට ආයතනයට අභියෝග කරන්න පුලුවන්. ඒත් අපිට බෑ ඉංජිනේරුතුමා දෙන නිර්දේශ අභියෝගයට ලක් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- ගෙනල්ලා සතියක් දෙකක් වැඩ කරන්න බැරිනම් ඒකෙන් වැඩක් නෑ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ඒක හරි මම පිළිගන්නවා. මම හිතන්නේ නෑ ආයි ගෙනවා කියලා වැඩ ගන්න පුලුවන් වෙයි කියලා.

ජේ.සී.බී. යන්ත්‍රය ගැන සහ ප්‍රීමික්ස් ව්‍යාපෘතිය ගැන සභාව දැනුවත් කිරීම සඳහා කාරක සභාවක් යෝජනා කරනවා මම.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා ජේ.සී.බී. යන්ත්‍රය පිළිබඳ පහත අදහස් දක්වන ලදී.

- ❖ අප ප්‍රාදේශීය සභාවේ ජේ.සී.බී. යන්ත්‍රය ක්‍රියාකාරීව පවතී නම් කුලී පදනම මත ජේ.සී.බී. යන්ත්‍රයක් සහ එක්ස්කැවේටර් යන්ත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවන බව.
- ❖ අප ප්‍රාදේශීය සභාවේ රියදුරන් රාජකාරි කරන්නා වූ විලාශය පිළිබඳව

කාරක සභා අවස්ථාවේදී තාක්ෂණ නිලධාරි දිනුෂ රත්නප්‍රිය මහතා විසින් ප්‍රීමික්ස් සකස් කිරීම සඳහා අවශ්‍ය වන ද්‍රව්‍ය වල ඇති අඩුපාඩුකම් ගැන සභාව දැනුවත් කරන ලදී.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** ඃ- කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- ඊළඟට ගරු සභාපතිතුමනි, මේ වෙන්දේසි ඉඩම්වල අවුරුදු 05 ක නඩත්තුව පිළිබඳ ගිවිසුමක් අත්සන් කරනවා. ඔබතුමාට මේ සම්බන්ධව අත්දැකීම් තියෙනවා. දැන් හරි අපි මේක පටන් ගන්න ඕන. පැතුම් උයනේ සිලින්ඩර් කැඩිලා ගිහින්. ඒක දාපු වැරදි ක්‍රමය නිසා තමයි කැඩිලා ගියේ. වහාම ඒ සිලින්ඩර් දාන්න කියලා ඒ ආයතනය දැනුවත් කරන්න.

ඊරියහහ දූව පාරේ අද වෙනකොට යන්න බෑ. මුළු පාරේම දාපු ඒ ලෑලිත් කැඩිලා ගිහිල්ලා. පාර සම්පූර්ණයෙන්ම ගන්න දෙයක් නෑ. පාර සේද පාර දැම්ම වගේ වැරදි විදියට දැම්මේ. මාස දෙකක් තුනක් විතර යනකොට ඔක්කොම ඉවරයි. මම යෝජනා කරනවා ඔබතුමන්ලාට වහාම එම ආයතනවලට දැනුම් දෙන්න. තවත් මේ වගේ ප්‍රශ්න තියෙයි නම් මන්ත්‍රීවරු ඒවා පිළිබඳ දැනුම් දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- ඒ ප්‍රශ්න ලිඛිතව සභාවට දැනුම් දෙන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා** :- ඊළඟට බෝපෙ පෝද්දල පොදු ළිං වැහීම ගැන කතා කරා සුමිත් උප සභාපතිතුමා. ඒකේ ඇත්තක් තියෙනවා. නමුත් එකක් තියෙන්නේ වහපු ළිඳක් තියෙනවා ඉලේපෙරුම මාවතේ. ඒ ඉඩම මේ වෙනකම් බේරගෙන තියෙන්නේ. හැබැයි කොයි වෙලාවේ අල්ල ගනියිද දන්නේ නෑ. ඒක ගැන බලන්න ඕන. ඊළඟට බෝපෙ හතර දේවාලය ගාව ළිඳ අපි වැහුවා. දැන් ඒක අත්පත් කරගෙන ඉන්නේ කෙනෙක්. වහාම ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගන්න. ඊළඟ සභාව වෙනකොට මේ සම්බන්ධව ප්‍රගතිය ලබා දෙන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** නාවින්න අරලිය වත්තේ කොස් ගහ කපන්න මිල ගණන් කැඳෙව්වා. කොස් ගස කැපුවට ප්‍රවාහනය කරන්න අවසර දෙන්නේ නෑ ප්‍රාදේශීය ලේකම්තුමා. ප්‍රාදේශීය ලේකම්තුමා දැනුම් දීලා තියෙනවා ඔබතුමාට මේ සම්බන්ධයෙන් නඩුවක් තියෙනවා කියලා. මම කිවුවා කලින් සභාවේදී මෝෂන් එකක් දාලා හොයලා බලන්න කියලා. ලේකම්තුමා කිව්වා එහෙම අවශ්‍ය නෑ කියලා. නඩුව අවසන් වෙලා නඩු තීන්දුවත් දීලා ඉවරයි. දැන් ප්‍රාදේශීය ලේකම්තුමා කිවුවා ඔබතුමාගෙන් වාර්තාවක් ආවේ නෑ කියලා ප්‍රවාහනයට බලපත්‍රය දෙන්න. ඔබතුමා ලියුමක් යවන්න ඕනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මේක සම්බන්ධව නඩුවක් තිබුණා ඒකෙන් පාර මැනලා වෙන් කරලා දීලා තියෙන්නේ දැන් පාර අයිති ප්‍රාදේශීය සභාවට කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** :- අරලියගහවත්තේ කොස්ගස කැපීමේ ප්‍රශ්නය පිළිබඳ සභාව දැනුවත් කිරීම සඳහා මම කාරක සභා අවස්ථාවක් යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

<u>කාරක සභා අවස්ථාව</u>

කාරක සභා අවස්ථාවේදී ලේකම් එල්. එච්. අනිල් රංජන් මහතා විසින් නාවින්න අරලිය වත්තේ කොස්ගස කපා ප්‍රවාහනය කිරීමට ඇති බාධාව පිළිබඳ සභාව දැනුවත් කරන ලදී.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** කාරක සභා අවස්ථාව අවසන් කිරීම සඳහා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා :-** අරලියවත්ත පාරට සල්ලි ඇවිල්ලා තියෙන්නේ. අප්‍රේල් මාසෙන් පස්සේ ඒ සල්ලි නැවත යනවා. අප්‍රේල් 20 ට කලින් වැඩ ඉවර කරන්න ඕන. ඒ

වගේ පාරක් සභාවෙන් කරන්න අමාරුයි. ඒක නිසා ප්‍රාදේශීය ලේකම්තුමාව මේ ගැන දැනුවත් කරලා සති දෙකක් ඇතුළත කොස් ගහ කපලා ඉවර කරලා දෙන්න පාර හදන්න.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ගිය සභාවේදී මම කතා කරපු මාර්ගය පුළුල් කිරිමේ කාරණය පිළිබඳව තවත් විස්තර හොයා ගනිපු නිසා ඒ ගැන සභාව දැනුවත් කල යුතුයි.

මීපාවල තැපැල් කන්තෝරුව ඉදිරිපිට පාර පුළුල් කිරිමේ ගැටලුව මේ. ඔබතුමා මේ පිළිබඳ ක්‍රියාත්මක වෙලා ලිපියක් යොමු කරලා තිබුණා. ඒක ගැන හොයාගෙන යනකොට ඒ ලිපිගොනුවේ ලිපි හයක් යවලා තියෙනවා ගොඩකන්ද කියන මහත්තයාට. ඒ ලිපි වලින් එක ලිපියක් විතරයි ඒ මහත්තයාට ලැබිලා තියෙන්නේ. ඉදිරියේදී දැන ගන්න අවශ්‍යයි එම ලිපි ලියාපදිංචි තැපැලෙන්ද යැව්වේ, සාමාන්‍ය තැපැලෙන්ද යැවුවේ කියලා.

ගෙවල් 11 ක් තියෙනවා ඒ පාර භාවිතා කරන. 10 දෙනෙක් අත්සන් කරලා තියෙනවා ඒ පාර පුළුල් කිරිම අවශ්‍ය නෑ කියලා. ඒ ලිපියත් ඉඩම් අමාත්‍යාංශ ලේකම්ට යවලා තියෙනවා. එතුමාගේ පරීක්ෂණයට සියලු විරෝධතා ගොනු කරලා යවලා තියෙන්නේ. ගැසට් එක නිකුත් කරපු නිසා දැන් සභාවට කරන්න දෙයක් නෑ. නමුත් ගැසට් එකේ ක්‍රියාකාරීත්වය නවත්වන්න ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විරෝධතා ගොනු කරලා තියෙනවා. ඒ විරෝධතාකරුවන්ගෙන් මට ආපු ගැටලුව තියෙන්නේ ඇයි මේ ගොඩකන්ද කියන මහත්තයා නොදැනුවත්ව සියලු කරුණු ඉටු වුනේ කියලා. මිනින්දෝරුවෙක් මැනලා තියෙනවා. සැලැස්මක් ඇඳලා තියෙනවා. ගොඩකන්ද මහත්තයාගේ පාර්ශවය දන්නේ නෑ මේ ගැන. ඒක පාර්ශවීයව තමයි පරීක්ෂණය සිදු වෙලා තියෙන්නේ. ඒක නිසා මම කාටවත් ඇඟිල්ල දිගු කරන්නේ නෑ පුද්ගලිකව.

නමුත් මම හෙලා දකින කාරණාවක් ගිය සභාවේදී කිවුවා. මේ සභාවේ කතා කරන ඒවා අනෙක් පාර්ශවයේ පුද්ගලයාට රෙකෝඩ් කරලා ලබා දෙනවානම්, මේ කතා කරන එක ෆෝන් එකෙන් කෝල් එකක් අරගෙන ඒ අයට අහන්න සලස්වනවනම් මන්ත්‍රීවරු විදියට මේ සම්බන්ධව විරුද්ධ විය යුතුයි. මම දන්නේ නෑ පුද්ගලයා කවුද කියලා. ඒක බොහොම නින්දිත ක්‍රියාවක් විදියට මම හෙලා දකිනවා. මම සභාවෙන් නැගිටලා යන්න ඉස්සර වෙලා මට කෝල් එකක් එනවා. මම කතා කරපු ඒවා ඒ පැත්තට ගිහිල්ලා. මම බය නෑ. බය නැති නිසා තමයි අදත් මේ කතා කරන්නේ. දැන් වුනත් මම සූදානම් මේ කතා කරන එක එයාට ඇහෙන්න සලස්වන්න. මම නීත්‍යානුකූලව කරන්න පුලුවන් හැම දේම මේ වෙන කොට කරලා තියෙනවා. සභාවක් විදියට මන්ත්‍රීවරු දැනුවත් වෙන්න මේක බොහොම අපහසුතාවයට පත්වෙන නින්දිත ක්‍රියාවලියක්. ඒක නිසා ඒක නවත්වන්න. ඔබතුමා නැවත ස්ථානීය පරීක්ෂණයක් සිදු කරන්න. ඒකට දිනයක් දාගෙන මාවත් දැනුවත් කරන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** පහුගිය සභාවේදී මම හිටියේ නැතිවෙලාවේදී සඳහන්වෙලා තිබුණා මමත් ඒකට කැමතියි කියලා. ඇත්තටම මම කැමති, මුළු සභාවම අනුමත කරපු දේ තමයි ඒ කරලා තියෙන්නේ. ඊට වැඩිය දෙයක් කෙරිලා නෑ. චමින්ද මන්ත්‍රීතුමා එක්ක මගේ පෞද්ගලික අමනාපයක් නෑ. ඒ සඳහා විරෝධතා දක්වනවානම් ඒකට වෙලාව තිබුණා. මට පළවෙනි ප්‍රශ්නය තමයි ඔක්කොටම වැඩිය වැදගත් වෙන්නේ. අද මේ සභාවේ කතා කරන දෙයක් රෙකෝඩ් කරලා කාටවත් දෙන්න ඕන නෑ. වාර්තා බැලුවහම තියෙනවා. ඒ හින්දා එහෙම වුවමනාවක් නෑ. එදා කිව්වා අබේසේකර මන්ත්‍රීතුමා නම් අද ලැස්තිවෙලාම ඇවිත් තියෙනවා කියලා. ඒක හරි. මම ලැස්ති වෙලා ආවේ. මේ ප්‍රශ්නය එනවා කියලා මම දැනුවත් වුනා. ප්‍රශ්නයක් වුනහම ඔබතුමාවත් කට්ටිය දැනුවත් කරනවා. මාවත් කට්ටිය දැනුවත් කරනවා. මාව දැනුවත් කරලා ඒ පින්තූරත් ලබා දුන්නා. මම ඒවා අරගෙන ආවා සභාවට. ඒ ආරවුලකට නෙමෙයි. මම එළියට ගිහින් කියලා ආවා මේ කතාව තමයි දැන් යන්නේ සභාවේ ඔබතුමා මෙහෙම කිවුවා කියලා මම කිවුවා. මට හංගන්න දෙයක් නෑ. ඒක ඔබතුමාට මොකක් හරි කරන්න නෙමෙයි කිව්වේ. මම කිවුවේ වෙච්ච දේ මේ වාර්තාවට යනවා අපි කතාකරපු සියලු දේ. හැංගිච්ච දෙයක් නෑ මේකේ. මේකට මුදල් ගෙවලා තියෙනවා.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- ප්‍රගති වාර්තාව ස්ථිර කරන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම වාර්තාව ඒකමතිකව සහා සම්මත විය.

**<u>II. ගෙවීම් අනුමැතියට ඉදිරිපත් කිරීම.</u>**

**<u>1. පොදු ගෙවීම්</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. 2019 පෙබරවාරි මාසයට අදාලව පරිගණක පුහුණුලාභීන් තිදෙනා හට දීමනා ගෙවීම. රු.29,000/=

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම ගෙවීම මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ගෙවීම ඒකමතිකව සහා සම්මත විය.

**<u>2. කර්මාන්ත ගෙවීම්</u>** ඃ- නැත

**<u>3. සේවක ණය ගෙවීම්</u>** ඃ- නැත

**<u>III. ඇස්තමේන්තු අනුමැතියට ඉදිරිපත් කිරීම.</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. මුලන මංජු මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම රු.80,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

02. නරාවල මාර්ටින් පෙරේරා මාර්ගය සංවර්ධනය කිරීම රු. 450,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

03. මල් මාවත ප්‍රියලාල් මහතාගේ නිවස අසල පැති කාණුව සංවර්ධනය කිරීම. රු.430,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

04. තොටගොඩ මහවත්තගොඩ මාර්ගය සංවර්ධනය කිරීම. රු.425,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සහා සම්මත විය.

05. තොටගොඩ හේනගොඩවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. රු. 1,000,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

06. තොටගොඩ හේනගොඩවත්ත මාර්ගය පුළුල් කිරීම. රු. 150,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

07. කරාපිටිය පන්විලදූව වත්ත II පටුමග සංවර්ධනය කිරීම. රු355,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

08. නාවින්න පාරේ බෝක්කුව සංවර්ධනය කිරීම රු. 170,000/=

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම ඇස්තමේන්තුව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම ඇස්තමේන්තුව ඒකමතිකව සභා සම්මත විය.

**IV. මිල ගණන් කැඳවීම්** ඃ- නැත

**V. ලිපි ඉදිරිපත් කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- 01. අබලි වාහන හා යන්ත්‍රෝපකරණ වෙන්දේසිය වෙනුවෙන් තබන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් නිදහස් කිරීම ( ටී. එස්. අබේවීර මයා, කුරුන්ද කන්ද, ලබුදූව)

එම ඉල්ලීමට අදාළ 2018.12.20 දිනැති ප්‍රා.ස බිල්පත් අංක 463 හා 464 මඟින් අබලි වාහන හා යන්ත්‍රෝපකරණ ටෙන්ඩරය වෙනුවෙන් තබන ලද ටෙන්ඩර් ඇප තැන්පතුව වන රු.6,000/=ක මුදල නිදහස් කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා** ඃ- එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා ඃ-** නැත

මීළඟ මහා සභා රැස්වීම 2019.04.11 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව 09.30ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදි.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව